

# සියල්ල අහිමි කරමින්

## බැඳීම් බිඳදමන

බය වෙන්න එපා..

# සෙනසුරු ඔබගේ හැරවුම් ලක්ෂ්‍යයයි

**විශ්ව කේන්ද්‍රයේ ආදරණීය ග්‍රහයා සිකුරු නොවේ සෙනසුරු කීවොත් ඔබ එකඟ වන්නේ නැහැ නේද? එයට හේතුව යමෙකුට මේ ලෝකයේ නිවැරැදි අවබෝධය උදාකර දෙන්නේ මෙන්න මේ සෙනසුරු ග්‍රහයාගෙන් බව ඔබ දන්නවාද? ඒ විතරක් නොවෙයි. තමන්ට තමන් කවුරුද යන වග නිවැරැදිව වටහලා දෙන්නේ මෙන්න මේ සෙනසුරු විසින්මය. ජීවිතේ ලැබෙන සියල්ල අහිමි කර වේගෙන් දුවගෙන යන ගමන මඳක් ප්‍රමාද කර ඔබව අවදි කරන භයානක අත්දැකීම්වලට ජීවිතය හමුවේ එන ප්‍රශ්න, ගැටලු, ව්‍යාකූලතා, බාධා, පීඩා, වේදනා හමුවේ ඔබටත් මෙම ගැටලු මතුවී මුහුණ දුන් අය මෙන්ම මුහුණ දෙන අය මෙන්ම මුහුණ දීමට ඉන්නා අය වෙනුවෙන් මෙම ලිපි පෙළ ඔබට ඉතා වැදගත් වනු ඇත.**

ජීවිතයේ තනිව බාධක මැද ඉදිරියට යෑමට ඔබට ඔබේ පෞරුෂය අවදි කර එඩිතරකම ලබාගන්න ශක්තිය දෙන සෙනසුරු ඔබව ලෞකික සැප සම්පත් ඔබේ ජීවිතයෙන් ක්‍රමානුකූලව ඈතට යවනු ඇත. යහපත් වූද, යුක්තිකරුක වූද, යථා අවබෝධයට මග පාදන්නාවූද සෙනසුරු ඔබේ ජීවිතය ශුභවාදී ලෙස මෙන්ම ඉතා දුක්ඛිත කයෝර අත්දැකීම් අත්විඳීම සමුදායක් හරහා ඔබට ලැබෙනු ඇත. ජීවිතය රස කරවන්නට මෙන්ම ජීවිතයේ සියල්ල නැති කර අත්ත අසරණ කරන්නටත් සෙනසුරුට මනා හැකියාවක් ඇත. නම ඇසූ සැණින් බිය උපද්දන්නට තරම් හැකියාවක් විශ්ව කේන්ද්‍රයේ ශනි ග්‍රහයාට දී තිබීම පුදුමසහගත වීමට තරම් කරුණක් නොවන්නේද එබැවිනි.

විශ්ව කේන්ද්‍රයට අනුව ගත්කල ශනි ග්‍රහයා 7 වැන්නට දිග් බලයෙන් බලවත් කර යොදා ඇත. එයට හේතුව 7 වැන්න මංගල ස්ථානය හෙවත් කලත්‍ර ස්ථානය ලෙස නියෝජනය වන ස්ථානයයි. එමෙන්ම මාරක ස්ථානයක් ලෙසද 7 වැන්න ක්‍රියා කරයි. ප්‍රජනන ශක්තිය මෙන්ම නිත්‍යානුකූල විවාහය, තමාට හිමි සහකාරිය හෝ සහකරුව ගැනද 7 වැන්නෙන් කියැවෙනු ඇත. හවුල් ව්‍යාපාර කටයුතු ගැනත් හවුල්කරුවන් කොටස්කරුවන් මුදල් ණයට දීම, මුදල් ණයට ඉල්ලා ගැනීම, මුදල් යොදා හවුලේ කරන වැඩ, ගිවිසුම් කටයුතු, ඒ වගේම දන් ලැබීම්, හිගමන් ලැබීම, දඩ ගැසීම, නීති පොරොන්දු, දික්කසාද සම්බන්ධ ගැටලු, නැති වූ දේ ලැබීම් ආදී වූ රාශියක් කාරණා විශ්ව කේන්ද්‍රයේ 7 වැන්න දිග් බලයෙන් යුක්තව ශනි හෙවත් සෙනසුරු ග්‍රහයාට ලබාදී ඇත.

ඉතාම කටුක කයෝර දුක් වේදනා දරාගෙන මනා ඉවසීමෙන් කටයුතු කළ යුත්තේ කෙසේද යන වග කියා දීමට සෙනසුරු තරම් කිසිම ග්‍රහයෙකු සමත් වන්නේ නැත. නන්දෙසින් ගලා ආ ඇමතුම් මෙන්ම කේන්ද්‍ර සටහන් පරීක්ෂාවේදී මා එය ඉතා සියුම්ව අධ්‍යයනය කළේ බොහෝ දෙනාගේ බියෙන් ඔවුන් කෙතරම් දුරට මුදා ගැනීමට හැකිද යන වග අවබෝධ කරගනිමින්ය. එහිදී ශ්‍රී විෂ්ණු දෙවියන් උදෙසා සෙත්කවි රචනා කිරීම මෙන්ම එම කේන්ද්‍ර පරීක්ෂා කොට ඊට අදාළ පෞද්ගලිකව වත් පිළිවෙත් සඳහන් කිරීමෙන් ඒවා නිවැරදිව අවබෝධයෙන් කරගැනීම තුළින් ඔබගේ දිවියට සහනය සුවය යහපත උදා කිරීමේ හැකියාව ඇති බවත් මා මෙහි දී සඳහන් කරන්නේ මෛත්‍රී සිතින් යුතුවය.

බොහෝ දුරට සෙනසුරු අපල ඊර්ෂ්‍යාව හමුවේ ඔබට හුදකලා වීම, තනිව කටයුතු කරගැනීමට සිදුවේ. එසේම හුදකලාවට බිය නොවී අභියෝග බියක් ඇති නොකර ගනිමින් බැඳීම් පිළිබඳවත් ධර්මය අවබෝධයෙන් යුතුව ශක්තිමත් මනසක් ඇති කරගනිමින් අවබෝධයෙන් යුතුව අවදියෙන් මෙම කාලසීමාව ඔබ විසින් ගතකිරීමට ඔබ මනා සේ දක්ෂ අයකු කරවීමට සෙනසුරු ග්‍රහ බලපෑම සමත් වනු නොඅනුමානය. පෙර කළ අකුසල් ඔබ සොයා ඇවිත් ඇත්තේ සෙනසුරුගේ පීඩාවන් හමුවේ ඔබගේ වැඩකටයුතු අඩාළ වීමක් සමගිනි. එසේ නම් ඔබට සියකරු ගමනක ආරම්භය ලෙස දැනෙන ඉඩකඩ දැන් දැන් පෙනෙන්නට දැනෙන්නට පටන්ගෙන ඇත.

මිනිසා කුමකුමයෙන් තනිවීමට මගරකතු දෙන්නේ මෙන්න මේ කියන සෙනසුරු ඊර්ෂ්‍යක අපල කාලසීමාවේදීය. මිනිසා විසින් ඇද බැඳ තබාගත් සියල්ල අහිමි කර සෙනසුරු අපලය ඵල විපාක සකස් කර දීම සිදුවන්නේ ඔබ අප කිසිම කෙනෙක් සිතනා පතනා ආයුරින් නොවේ. එයට හේතු කාරණා බොහෝ ඇත.

සෙනසුරුට හිමි මහ දශා කාලය සෙනසුරු අතුරු දශා කාලය, සඳුගේ නැකැතට සෙනසුරු ගමන් කිරීම සඳුගේ රාශියට ගෝචර ගමනින් සෙනසුරුගේ පැමිණීම මෙන්ම සඳුගෙන් 6-8-12 වැන්නේ සෙනසුරුගේ ගමන් කිරීම, උත්පත්තියේ සඳු සමග යෝගව සතුරු දුෂ්ට ත්‍රික ස්ථාන හෙවත් 6-8-12 වැන්නේ සිටීම, සෙනසුරුගෙන් අශුභ ඵල උදාකරවන කණ්ඨක ශනිගේ ගෝචර ගමන මෙන්ම ඔබේ කේන්ද්‍ර සටහනේ මාරක ග්‍රහයා ලෙස සෙනසුරු යෙදී ඇති විට බලපවත්නා තත්ත්වයන් මෙන්ම සෙනසුරුට ලැබෙන අශුභ දෘෂ්ටි, සෙනසුරු ලග්නයේ සහ නවාංශකයේ පාප සංයෝග වීම, පාප කත්‍රී වී පාප දෘෂ්ටි හෙළීම, චන්ද්‍රයා උත්පත්තියේ සිටි රාශියට හෝ එම රාශියෙන් දෙපස සෙනසුරු ගමන් කරනා විට ඔබට ඇතිවන බලපෑම් ඔබේ ජීවිතයේ ඒකාන්තයෙන්ම හැරවුම් ලක්ෂ්‍ය ලෙස ඔබට දැනටමත් දැනී ඇත.

මෙහිදී සෙනසුරු ලග්නයේ ගමන් කරන විට ලග්නයෙන් 6-8-12 ගමන් කරන විට කේන්ද්‍ර සටහනේ පිහිටීම මත ශුභ අශුභ සම මිශ්‍රලු උදාකර දුන්නද සෙනසුරුගේ දයාද කෙසේ හෝ මිනිසාට ලබාදීමට කටයුතු යොදන්නේ ඔබ අප කවුරුත් හිතන ආකාරයට නොවීමද මෙහිදී සඳහන් කළ යුතුව ඇත. ලග්න ලෙසට විවිධාකාර ආකාරයේ බලපෑම්, අපල උපද්‍රව, ලැබීම්, අහිමි වීම් සිදුවීම පවා ඉතා පුදුමසහගත අයුරින්ම සිදුවන්නේ කේන්ද්‍ර පරීක්ෂණයේ ලද්දා වූ අත්දැකීම් මගිනි. කෙසේ නමුත් සෙනසුරුගේ අශුභ දෘෂ්ටින්, ශුභ ග්‍රහයකුට හමුවූ කල එම ශුභ ග්‍රහයාගේ ශුභ තත්ත්වයට පවා බලපෑම් කිරීමට සෙනසුරුට නිතැතින්ම හැකිවී ඇත්තේ වරදට නිසි දඬුවම දෙන්න සෙනසුරු ඔබේ ජීවිතයට පැමිණ ඇති බව සියල්ල අමතක කර එය පමණක් මතක් කර දෙන ලෙසිනය. මෙහිදී නිවැරැදිව එය හඳුනාගෙන මනා අවබෝධයෙන් සිහි නුවණින් කල් තියා වටහාගත් අයකු නම් ඔබ ඉතා වාසනාවන්ත සත්‍යකයින් පෙර පින් බොහෝ ඇති අයකු ලෙස කිව හැකිය. එසේ වනුයේද ඉතා කලාතුරකිනි. ප්‍රශ්න කරදර බාධක නොමැති කල අප ඊට පිළියම් යෙදීමට නොයන බැවින් කල් තියා දැනගැනීම අවබෝධය ඇතිකරන් කටයුතු කරන පිරිස අප අතරේ ඉතා අල්ප ප්‍රමාණයක් ඇත.

කෙසේ නමුත් මෙවැනි වූ ලිපි පෙළකින් මා ඔබව දැනුවත් කරන්නේ ඔබට ඇති ගැටලු ප්‍රශ්න ඉතා ඉවසීමෙන් දුරදිග බලා ලෙහා ගැනීමට ඔබටම උනන්දුවක් ඇතිකිරීම පිණිසය. අවදානමට පෙර සූදානම් වීමෙන් ඔබගේ කේන්ද්‍රයේ සෙනසුරුට හිමි තැන ඔබ විසින් සොයා අවදියෙන් සිටීමට සුදුසු කාලය එළඹ ඇත. එසේ නම් මෙවැනි වූ ලිපි පෙළකින් නැවතත් ඔබව දැනුවත් කිරීමට මම සූදානම්. එතෙක් ඔබ සැමට සියලු යහපත උදාවේවා...

**ජ්‍යොතිර්වේදිනී පී.එම්. සංජීවී වසන්ති**



ජ්‍යොතිෂ විද්‍යා ඩිප්ලෝමාධාරිනී / ජ්‍යොතිෂ ශිරෝමනී, ජ්‍යොතිෂ අභිෂේකා විශිෂ්ට ගෞරව සම්මානලාභිනී, ජ්‍යොතිෂ ශාස්ත්‍ර විශාරද විශිෂ්ට ගෞරව සම්මානලාභිනී
සංජීවී ජ්‍යොතිර් නිවස
දුරකතන - 0777 130391

---

## මාතර- ඇමැති කීර්ති අබේවික්‍රම මැරුණා

## ලලිත් ඇතුලත්මුදලිට බරපතළ තුවාල

## ප්‍රේමදාසට ජේ.ආර්.ට සුළු තුවාල



# පාර්ලිමේන්තුවට ගැසූ ජවිපෙ බෝම්බයට අවුරුදු 40යි

**1987 පාර්ලිමේන්තුවට එල්ල කරපු බෝම්බ ප්‍රහාරයේ ඉලක්කය වුණේ ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාය. ඒ බෝම්බ ප්‍රහාරය කොයිතරම් සැලසුම් සහගතව කරපු එකක්ද කියල කියනවා නම් පාර්ලිමේන්තුවට දැඩි ආරක්ෂාවක් දීලා තියෙද්දි තමයි ඒ බෝම්බය ඇතුළට අරගෙන ඇවිත් තියෙන්නේ. පාර්ලිමේන්තුවට ගෙනියන හැම දේම දැඩිව සෝදිසි කරලා තමයි ඇතුළට ගන්නේ. බාහිරින් පාර්ලිමේන්තුවට ඕනෙ ඕනෙ දේවල් ගෙනියන්න බෑ කාටවත්ම. විවිධ ආරක්ෂක විධිවිධාන පාර්ලිමේන්තුවෙ තියෙද්දි තමයි මේ බෝම්බය ඇතුළට ගෙනත් තියෙන්නේ.**

ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඉලක්ක කරලා බෝම්බය එල්ල කළත් එතුමට ඒකෙන් ලොකු හානියක් වුණේ නෑ. ඔහුට සුළු තුවාලයක් විතරයි වුණේ. අගමැති ප්‍රේමදාස මහත්තයටත් පොඩි තුවාලයක් වුණා. මේ බෝම්බ ප්‍රහාරයෙන් එවක ආරක්ෂක ඇමැති ලලිත් ඇතුලත්මුදලිට සැලකිය යුතු තරමේ හානියක් වුණා. ඒ එක්කම දෙණියායේ පාර්ලිමේන්තු මන්ත්‍රී කීර්ති අබේවික්‍රම ඒ බෝම්බ ප්‍රහාරයෙන් මියගියා. ඒ වගේම පාර්ලිමේන්තුවෙ ආණ්ඩු පක්ෂයේ සංවිධායක ලේකම් සේනාධීර කියන මහත්තයා මියගියා. තවත් කීපදෙනෙකුට මේ ප්‍රහාරයෙන් තුවාල සිද්ධ වුණා. මේ පාර්ලිමේන්තු බෝම්බ ප්‍රහාරය රටම හොල්ලපු සිදුවීමක් වුණා.

බෝම්බ ප්‍රහාරයට පස්සේ මේ ගැන දිගින් දිගටම පරීක්ෂණ පැවැත්වුණා. මේ පරීක්ෂණවලින් අවසානයේ හෙළිදරව් කරගත්තා අජිත් කුමාර කියලා පාර්ලිමේන්තුවෙ වැඩ කරපු සේවකයෙක් මේකට සම්බන්ධයි කියලා. දිගින් දිගට මේ අජිත් කුමාර කවුද කියලා ආරක්ෂක අංශ විසින් හොයන්න පටන් ගත්තා. අජිත් කුමාර කියන්නේ ඒ කාලේ ජනතා විමුක්ති පෙරමුණේ ඉඳපු විමල් වීරවංශගේ ඥාති සහෝදරයෙක්. මේකෙන් තත්ත්වය තවත් බරපතළ වුණා. මොකද මේ පුද්ගලයා ජනතා විමුක්ති පෙරමුණට සෘජු සම්බන්ධයක් තියෙනවා කියලා ආරක්ෂක අංශ කල්පනා කළේ. අජිත් කුමාරගෙ පසුබිම හොයන්න පටන් ගත්තා ඒ නිසා. අජිත් කුමාර කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධියක් හදාරපු කෙනෙක්. ඒත් අජිත් කුමාර පාර්ලිමේන්තුවට සේවකයෙක් විදියට ඇතුළු වුණු ආකාරය ගැන කිසිම තොරතුරක් හොයාගන්න බැරිවුණා. මේක දීර්ඝකාලීන සැලසුමක ප්‍රතිඵලයක් කියලා ආරක්ෂක අංශ සැක පහළ කළා. බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ අජිත් කුමාර අතුරුදන් වුණා. ඔහුව හොයාගන්න බැරි වුණා.

අජිත් කුමාර ගැන පරීක්ෂණ පවත්වපු ආරක්ෂක අංශ අජිත් කුමාරට සම්බන්ධකම් තිබුණු අයගේ තොරතුරුත් හොයන්න පටන් ගත්තා. බෝම්බ ප්‍රහාරයෙන් වසර කීපයකට පස්සේ දඹුල්ල පැත්තෙ ගොවිපොළක ඉඳලා අජිත් කුමාර අත්අඩංගුවට පත්වුණා කියලා ප්‍රවෘත්තියක් අහන්න ලැබුණා. ඔහු ඒ නඩුවෙනුත් නිදහස් වුණා මං හිතන්නේ. කරුණු ඔප්පු කරගන්න බැරි වුණු නිසා.

මේ භීෂණකාරී තත්ත්වය තුළ වුණත් ජේ.ආර්. ජයවර්ධන ඉන්දු - ලංකා ගිවිසුම හරහා පළාත් සභා පනත ඉදිරිපත් කිරීම නැවැත්වුවෙත් නෑ.

## කැරලිකරුවන්ගේ වැරදුණු කුරුමානම

සුන්දර වෙරළින් හා පලා පැහැයෙන් සමලංකෘත වූ සුපුරුදු ශ්‍රී ලංකාව වෙනුවට, 1987 වසර වනවිට ඉන්දියානු හා ජේ.ආර්. ජයවර්ධන විරෝධයෙන් ගිනියම් වූ රටක් බවට ශ්‍රී ලංකාව පත්ව තිබුණි. 1987 ජූලි මස 29දා එවක ශ්‍රී ලංකා ජනාධිපති වූ ජේ.ආර්. ජයවර්ධන ඉන්දීය අගමැති රජීව් ගාන්ධි සමඟ ඉන්දු - ලංකා ගිවිසුම අස්සන් කළේය. ජේ.ආර්. ජයවර්ධනට ඉන්දු ලංකා ගිවිසුම අස්සන් කිරීමට සිදු වුයේද දැවැන්ත ජනතා විරෝධයක් මධ්‍යයේය. ජයවර්ධන පාලනය ඊට ප්‍රතිචාර දැක්වූයේ පොලිසිය ලවා වෙඩි තැබීමෙනි. මෙම ගිවිසුම රට පාවාදීමේ ගිවිසුමක් ලෙසත්, ජයවර්ධන ජනාධිපතිවරයා මවුබිමට ද්‍රෝහී වූවකු ලෙසත්, ඉන්දියානු හමුදාව ආක්‍රමණික හමුදාවක් ලෙසත්, හඳුන්වමින් ජනතා විමුක්ති පෙරමුණ ඊට එරෙහිව දැවැන්ත ජනමතයක් නිර්මාණය කළේය.

ඉන්දු - ලංකා ගිවිසුම මගින් ජයවර්ධන ආණ්ඩුව 13 වැනි සංශෝධනය ලෙස ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පළාත් සභා ව්‍යුහය එක් කරන ලදී. ගිවිසුම අස්සන් කරන දින ජයවර්ධන ජනාධිපතිවරයා විසින් රට පුරා ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කරනු ලැබූව ද එය නොසලකා දස දහස් ගණනින් ජනතාව රට පුරා පෙළපාළි පවත්වමින්, මහාමාර්ග වසා දමමින් විරෝධතාවය පළකළහ. මෙම ගිවිසුම තුළින් ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය උල්ලංඝනය වී ඇති බව සඳහන් කරමින් ජනතා විමුක්ති පෙරමුණ මවුබිමේ ස්වාධීනත්වය ආරක්ෂා කොට තහවුරු කිරීම අරමුණු කර සිය අරගලය පෙරට ගෙන යන ලදී. ගුරුවරුන්, ශිෂ්‍යයන්, ලිපිකරුවන්, වෙළෙඳුන් හා භික්ෂූන් වහන්සේලා එකතුකොටගෙන සිය අරගලය දියත් කරන ලදී. රට පුරා කැරලි කෝලාහල ඇතිවූ අතර ජන විරෝධයට ආණ්ඩුවට මුහුණ දීමට සිදු විය. තවද රට පුරා ඈත ගම් නගර සෑම එකකම පාහේ මිනිසුන් බොහෝ දෙනෙකුට ජීවිතවලින් වන්දි ගෙවීමට ද සිදුවිය. ඒ අයුරින් මුළුමහත් ශ්‍රී ලංකාව පුරාම සිදුවූ මිනිස් ඝාතන සංඛ්‍යාව මෙතෙකැයි නිශ්චිතවම කීමට නොහැකි නමුත් ඒවා පිළිබඳ විවිධ සත්‍ය වාර්තා ප්‍රකාශයට පත්වූයේය. මේ අතර ඉන්දු ලංකා ගිවිසුමෙන් කෝපයට පත්වූ පිරිසක් එවක එක්සත් ජාතික පක්ෂයේ තංගල්ල මන්ත්‍රී ජිනදාස වීරසිංහ මහතාට 1987 ජූලි මස විසිවැනිදාට තුඩුරු දිනකදී වෙඩි තබා ඝාතනය කර තිබුණේය. තත්ත්වය මෙසේ තිබියදී පාර්ලිමේන්තුව 1987 අගෝස්තු මස 18 වැනිදා දක්වා කල් දැමීමට එක්සත් ජාතික පක්ෂය තීරණය කළ අතර, ඒ පිළිබඳ ආණ්ඩු පක්ෂය මගින් කල් තැබීමේ යෝජනාවක් ජූලි මස 24 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

උද්ඝෝෂණ ක්ෂේත්‍රයේද බහු ජන ක්ෂේත්‍රයේද සහ සන්නද්ධ ක්ෂේත්‍රයේද ක්‍රියාත්මක වූ ජනතා විමුක්ති පෙරමුණ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය වර්ධනය වී රටට ප්‍රබල බලපෑමක් කරන ව්‍යාපාරයක් බවට පත්විය. ඉන්දු - ලංකා ගිවිසුමට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ කළ අරගලයේ ප්‍රබලතම සිදුවීම වූයේ 1987 අගෝස්තු 18 දින කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ කාරක සභා ශාලාවක පැවති ආණ්ඩු පක්ෂ මැති ඇමැතිවරුන්ගේ රැස්වීමකට එල්ල කළ බෝම්බ ප්‍රහාරයයි. මෙම බෝම්බ ප්‍රහාරය ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා ඉලක්ක කරගෙන එල්ල කළත් ඔහු ගැලවී ලලිත් ඇතුලත්මුදලි මහතා බරපතළ තුවාල ලැබීය.

එම රැස්වීම පාර්ලිමේන්තු සංකීර්ණයේදී 1987 අගෝස්තු මස 18 වැනිදා පෙරවරු 8.40 ට ඇරඹී අතර, සහභාගි වූයේ 120 දෙනෙකු පමණි. එදින රට පුරාත් විශේෂයෙන් පාර්ලිමේන්තුව හා එහි අවටත් ආරක්ෂක නිලධාරීන් යොදවා තිබිණි. ඝාතනයට ලක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ජිනදාස වීරසිංහ මහතා සැමරීම සඳහා විනාඩි දෙකක නිහැඬියාවක් මුලින්ම පැවැත්විණි. මෙම රැස්වීමේදී ප්‍රධාන වශයෙන් කතාබහ කිරීමට නියමිතව තිබුණේ ජේ.ආර්. ජයවර්ධන හා රජීව් ගාන්ධි අස්සන් තැබූ ඉන්දු - ලංකා ගිවිසුම පිළිබඳ රටේ උද්ගතව ඇති තත්ත්වයන් සමාලෝචනය කිරීමය. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා මුලසුනේ සිටි අතර, මෙම රැස්වීමේ ප්‍රධාන අසුන්වල අගමැති ආර්. ප්‍රේමදාස, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ඇම්. වින්සන්ට් පෙරේරා, රොනී ද මැල්, ඊ.එල්.බී. හුරුල්ලේ, මොන්ටේගු ජයවික්‍රම, ලලිත් ඇතුලත්මුදලි, යූ.බී. විජේකෝන් සහ කීර්ති අබේවික්‍රම යන මහත්වරු රැඳී සිටියහ.

ආණ්ඩු පක්ෂ රැස්වීමේදී ජනාධිපතිවරයා මැති ඇමැතිවරු අමතමින් සිටි අවස්ථාවේ එතුමාගේ වම්පසින් කිසිවකු විසින් එල්ල කළ බෝම්බයක් ජනාධිපතිවරයාගේ මේසය අසල වැටී ලලිත් ඇතුලත්මුදලි මහතාගේ පුටුව අසල පුපුරා ගියේය. රැස්වීම් ශාලාව කළු දුමාරයෙන් වැසුණු අතර, ඒ සමගම එල්ලවූ තවත් බෝම්බයක් මාතර දිස්ත්‍රික් ඇමැති කීර්ති අබේවික්‍රම මහතා අසලදී පුපුරා ගියේය. එම අවස්ථාවේදී 'අපි ඉවරයි හැම තැනම බෝම්බ බිම දිගාවෙයල්ලා' මෙසේ කියමින් ඝෝෂා කළ මන්ත්‍රීවරුන් එක පොදියට ශාලාවෙන් පිටවීමට උත්සාහ දරන ලදී. ඒ වනවිට මූලාසනයේ සිටි ජනාධිපතිවරයාත්, ඒ සමග සිටි අගමැතිවරයා සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ක්‍රීඩා ඇමැති වින්සන්ට් පෙරේරාත් බෝම්බ ප්‍රහාරයෙන් බේරීමට මේසය යටට රිංගාගෙන තිබුණි. ජනාධිපතිවරයා මේසය යටට යැවුවේ අගමැති ප්‍රේමදාස මහතාය. පිපිරීම් හඬ නැවතුණු අතර, සභා ගර්භය තුළ ලේ ගංගාවක් වගුරුවමින් සියල්ල සුනුවිසුනු කරමින් ශාලාව දුම්වළාවක් බවට පත්ව තිබිණි. කළු දුමාරයෙන් වැසීගොස් තිබුණු ශාලාව තුළ පැවති අඳුරු පැහැය ක්‍රමයෙන් ඉවත් වුණු අතර, මේසය යටට රිංගාගෙන සිටි මැති ඇමැතිවරු බිම දිගේ බඩගාගෙන ශාලාවෙන් පිටතට පැමිණියහ.

තුවාල නොලබා සිටි මැති ඇමැතිවරු පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය සමග එක්ව තුවාලකරුවන් ඔසවාගෙන මන්ත්‍රී පිවිසුම වෙත පැමිණියහ. ඒවන විට තුවාලකරුවන් රෝහල් කරා රැගෙන යාමට මැති ඇමැතිවරුන්ගේ වාහන මන්ත්‍රී පිවිසුම ඉදිරිපිට නවතා තිබිණි. ආරක්ෂකයෝ වහා ඔවුන් වාහනවල දමාගෙන පිටමං කළහ. ඒ අතර ගතවූ මිනිත්තු කිහිපයේදී පොලිස්පති හේරත් හා රහස් පොලිසියේ අධ්‍යක්ෂ නියෝජ්‍ය පොලිස්පති ෆ්‍රැන්ක් සිල්වා යන මහත්වරුද රහස් පොලිසියේ පොලිස් නිලධාරීන් පනස්දෙනකු පමණ ද පාර්ලිමේන්තු සංකීර්ණයට ඇතුළු වූහ. ඒ සමග කොමාන්ඩෝ පොලිස් කණ්ඩායම් හතරක්ද ප්‍රධාන පිවිසුම අබියස රැකවල්ලා ගත්හ. එකවර හතර පැත්තෙන් හෙලිකොප්ටර් හතරක් පාර්ලිමේන්තු සංකීර්ණයට ඉහළින් පියාසර කරන ලද්දේද මේ අවස්ථාවේදීය.

බෝම්බ ප්‍රහාරයෙන් බරපතළ තුවාල ලබා සිටි මාතර දිසා ඇමැති කීර්ති අබේවික්‍රම මහතා සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නෝබට් සේනාධීර මහතා කොළඹ ජාතික රෝහලටත්, ජාතික ආරක්ෂක ඇමැති ලලිත් ඇතුලත්මුදලි මහතා ශ්‍රී ජයවර්ධනපුර රෝහලටත් රැගෙන යන ලදී. තුවාල ලබා සිටි සෙසු තුවාලකරුවන් ද කොළඹ සහ ජයවර්ධනපුර රෝහල් කරා රැගෙන යන ලදී. මෙම සිද්ධියෙන් පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නෝබට් සේනාධීර මහතාගේ හිසට බරපතළ ලෙස තුවාල සිදුවී තිබිණි. එදින පෙරවරු 11ට පමණ ශල්‍යාගාරය තුළදීම කීර්ති අබේවික්‍රම මහතා ජීවිතක්ෂයට පත්විය. එමෙන්ම පසුව නෝබට් සේනාධීර මහතා ද ජීවිතක්ෂයට පත්විය. තුවාල ලැබූ ලලිත් ඇතුලත්මුදලි මහතාගේ කලවා ප්‍රදේශයේ අවයව කිහිපයක් ශල්‍යකර්මයකින් ඉවත් කරන ලදී. ප්‍රහාරයෙන් අගමැති ප්‍රේමදාස මහතාට ද සුළු තුවාල සිදුවී තිබිණි. 'ජනතා විමුක්ති පෙරමුණු ත්‍රස්තවාදීන් මීට වගකිවයුතුයි. සන්සුන් වන්න, මේ ප්‍රහාරය රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වෙත එල්ලවූ ප්‍රහාරයක්' යැයි දිවි බේරාගත් ජනාධිපති ජයවර්ධන ජනතාවට පැවැසීය. එමෙන්ම ජනාධිපතිවරයා මෙම සිදුවීම හැඳින්වූයේ 'ශ්‍රී ලංකාවේ ඒකීයභාවයට එරෙහිව දකුණේ ත්‍රස්තවාදීන් දියත් කළ ප්‍රහාරයක්' බවය. ඒ හැර ඉන්දු ලංකා ගිවිසුමෙහි විරෝධතාකරුවන් දුටු එක් දුබලතාවයක් පිළිබඳවත් ඔහු වචනයකුදු කතා නොකළේය.

ප්‍රහාරයෙන් පසු එකී ප්‍රහාරයේ වගකීම බාර ගනිමින් දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය 'ද්‍රෝහීනි අප තොපට බෝම්බ ගැසුවේ මේ නිසයි' යනුවෙන් පත්‍රිකාවක් නිකුත් කරන ලදී. එමගින් ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට එරෙහිව චෝදනා ගණනාවක් ඉදිරිපත් කරනු ලැබීය. එම පත්‍රිකාව තුළින් ජීවත්වීමට ආසා ඇති සියලු මන්ත්‍රීන්ට තම ආසනවලින් ඉල්ලා අස්වී තම වැරදි පාපෝච්චාරණය කළ යුතු බවත්, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාට එරෙහිව නැගී සිටිය යුතු බවත් ප්‍රකාශ විණි. ඊට අමතරව ජනතා විමුක්ති පෙරමුණේ මැදිහත්වීම මත රට පුරා කළු කොඩි ඔසවා නොයෙක් ආකාරයේ රාජ්‍ය විරෝධී ක්‍රියා සිදුකරන ලදී. රාජ්‍ය දේපළ විනාශ කිරීම, රාජ්‍ය විරෝධී පෝස්ටර් හා පත්‍රිකා බෙදා හැරීම ආදී ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. මෙම ව්‍යාපාරවලදී අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය, දේශප්‍රේමී භික්ෂු පෙරමුණ හා අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බලමණ්ඩලය යන විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංවිධාන නායකත්වය ගෙන ක්‍රියා කරන ලදී.

පාර්ලිමේන්තු බෝම්බ ප්‍රහාරය ගැන දීර්ඝ පරීක්ෂණයකින් පසුව ප්‍රහාරයේ සැකකරු ලෙස පාර්ලිමේන්තුවට ආහාර සැපයූ බාහිර සේවකයකු වූ අජිත් කුමාර නමැති අයව අත්අඩංගුවට ගන්නා ලදී. නමුත් ඔහුව අත්අඩංගුවට ගනු ලැබූයේ බෝම්බ සිද්ධියෙන් හඳුනාගනිමින් නොව මාතලේ නාඋල ප්‍රදේශයේදී නීති විරෝධී මත්පැන් වැටලීමකදී අහම්බයෙන් තවත් සිවු දෙනකු සමගය. කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබමින් සිටියදී ඉන් ඉවත්ව ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරිකයකු වූ ඔහුව අත්අඩංගුවට ගනු ලැබූයේ ප්‍රහාර සිද්ධියෙන් මාස 08කට පසුව 1988 අප්‍රේල් මාසයේදීය. රටේ විධායක ජනාධිපතිවරයා ඇතුළු පිරිස ඝාතනය කිරීමට තැත් කිරීම ඇතුළු චෝදනා දහයක් ඔහු වෙත එල්ල විය.

අජිත් කුමාරට එරෙහිව සාධාරණ නඩු විභාගයක් පැවැත්වුණි. නඩුවලදී අජිත් කුමාර වෙනුවෙන් පෙනී සිටියේ එකල ජ්‍යෙෂ්ඨ නීතිඥයකු සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රබලයකු වූ සුසිල් මුණසිංහය. විනිසුරු ආනන්ද ග්‍රේරු සියලු සැකකරුවන් නිදහස් කළේ පැමිණිල්ල විසින් සැකයෙන් තොරව නඩුව ඔප්පු කර නැති බව කියමිනි. නීතිපති මෙම තීන්දුවට එරෙහිව අභියාචනා කළ ද එයත් ප්‍රතික්ෂේප විය. අවසානයේදී අධිකරණය අජිත් කුමාරව නිදොස් කොට නිදහස් කරන ලද අතර, එය දෛවෝපගත තීන්දුවක් විය.

එම්. තාරික්



## ශ්‍රේෂ්ඨාධිකරණය-සෙනෙට් සභාව කොංග්‍රසය විරුද්ධ වුණා

## බ්‍රිතාන්‍යය - යුරෝපය මැදපෙරදිග තරහා කරගත්තා

## රට ඇතුළේ ජනප්‍රියත්වය 36%ට බැස්සා

## ලෝකයක් ඉදිරියේ ඇමෙරිකාවට ලැජ්ජා කළා

## චීනෙයයි රුසියාවයි ගොඩ ගියා

# යුද්ධයෙන් ට්‍රම්ප් පරාදයි

**යුද පරාජයක් යනු යුද්ධයකදී හෝ යම් සටනකදී යම් පාර්ශ්වයක් තම ප්‍රතිවාදියා හමුවේ අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් හෝ පසුබෑමට, අඩපණ වීමට සහ පාලනය අහිමි වීමට ලක්වීමයි. මෙය හමුදාමය වශයෙන් මෙන්ම උපායමාර්ගික හා දේශපාලනික වශයෙන්ද බලපෑම් ඇතිකරන සංකීර්ණ ක්‍රියාවලියකි. යුද පරාජයක ප්‍රධානතම ලක්ෂණ ගණනාවක්ම දැකිය හැකිය. මෙහිදී හමුදාමය ක්‍රියාලියේ බිඳවැටීම ප්‍රධානතම තැනක් ගනී. එහිදී භූමි ප්‍රදේශ අහිමිවී යෑම මෙන්ම යුද උපකරණ සහ සටන්කාමීන්ගේ අහිමිවී යෑම සිදුවෙයි. තවද අණදෙන නිලධාරීන්ගේ නායකත්වයද අඩපණ වෙයි. එසේම යුද පරාජයකදී දේශපාලනික නායකයන්ගේ පසුබෑමද ප්‍රබල ලෙස බලපානු ලබයි. එනම් පරාජය වන පාර්ශ්වයේ ස්වෛරීභාවයට හානි වීම සහ ජාත්‍යන්තර වශයෙන් ස්ථානගතවීම දුර්වල වෙයි. තවත් යුද පරාජයකට හේතු වන්නේ යුදවදින පාර්ශ්වවල මානසික ධෛර්යය හීන වීමයි. මෙම තත්ත්වය අතිශය සංකීර්ණ ක්‍රියාවලියකි.**

යුද පරාජයක් යනු ආර්ථකථනය කරමින් මෙම කතාව ආරම්භ කිරීමට හේතු වූයේ ඇයි? එය නම් මෙයට දින කිහිපයකට පෙරදී ජාත්‍යන්තරයෙන් අපට අසන්නට ලැබුණු සුවිශේෂ පුවතක් හේතුවෙනි. එම කතාව කුමක්ද? 'ඩොනල්ඩ් ට්‍රම්ප් පරාදයි- ඇමෙරිකා -ඉරාන යුද්ධයෙන් ඇමෙරිකාව පරාදයි' යන කතාන්දරය පසුගියදා ගෝලීය මාධ්‍ය විසින් වාර්තා කරන ලද ප්‍රධානතම පුවතක් විය. ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් මෙයට මාස 4කට පෙරදී ඉරානයට එරෙහිව ආරම්භ කරන ලද මහා යුද්ධය දැන් මහා පරාජයකට ලක්ව ඇති ආකාරය මෙම පුවත්වලින් හෙළිවෙයි. ඔහු එලෙස යුද්ධය ආරම්භ කරන විටදී කියා සිටියේ ඉරානය කොන්දේසි විරහිතව යටත් විය යුතු බවත්, එසේම ඇමෙරිකාව යුද්ධයෙන් සම්පූර්ණ ජයග්‍රහණයක් ලබාගන්නා බවත්ය. එහෙත් අද සිදුව ඇත්තේ කුමක්ද? ඇමෙරිකාව ප්‍රකාශ කර ඇත්තේ යුද්ධය අවසන් කිරීමට ඉරානය සමග ගිවිසුමකට එළඹීමට කැමැති බවයි. මෙම ගිවිසුම ගැන ඇමෙරිකාව පසුගියදා තම කැමැත්ත ප්‍රකාශ කළ අතර එම ක්‍රියාවලියට මැදිහත් වීම සිදුකර ඇත්තේ පාකිස්තානය විසිනි. පාකිස්තාන අගමැති ෂෙබාස් ෂරීෆ් පසුගියදා මෙම ගිවිසුම ප්‍රකාශයට පත්කළ අතර, එය ඉදිරි දිනයකදී යුරෝපයේ රටකදී අස්සන් තැබීමට නියමිතය. මෙම ගිවිසුම ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්, උප ජනාධිපති ජේ.ඩී. වැන්ස් සහ ඉරාන පාර්ලිමේන්තු කතානායක මොහොමඩ් ගලිබාෆ් විසින් නවීන ඉලෙක්ට්‍රොනික තාක්ෂණය හරහා අස්සන් කළ බව ඇමෙරිකානු බලධාරීන් ප්‍රකාශ කර ඇත.

අවසන් ස්ථිර ගිවිසුම අස්සන් කිරීම ඉදිරි සතියේදී ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවරදී සිදුකිරීමට නියමිතය. ගිවිසුමේ මුල් පියවරේදී ඉරාන වරායන් සඳහා ඇමෙරිකානු නාවික හමුදා අවහිර කිරීම් වහාම ඉවත් කරන ලෙසට ජනාධිපති ට්‍රම්ප් නියෝග කර ඇත. එසේම ස්ථිර ගිවිසුම අස්සන් කිරීමෙන් පසු වසාදමා ඇති හෝමුස් සමුද්‍ර සන්ධිය විවෘත කරන බවද ඩොනල්ඩ් ට්‍රම්ප් ප්‍රකාශ කර ඇත. ඔහු තම Truth Social අන්තර්ජාල ගිණුමෙහි මෙවැනි ප්‍රකාශයක් තබා තිබිණි. 'ලෝකයේ නැව් වෙතයි ඔබගේ එන්ජින් පණගන්වන්න සැම දෙසටම තෙල් ගලායෑමට ඉඩ දෙන්න. මේ ගිවිසුම මගින් මුළු කලාපයටම සාමය සහ ආරක්ෂාව ගෙන එනු ඇතිය' යනුවෙන් සඳහන්ව තිබිණි. මෙම ක්‍රියාවලියත් සමග ඉරාන විදේශ අමාත්‍යවරයා රූපවාහිනියෙන් ප්‍රකාශයක් කරමින් කියා සිටියේ ඉරානයේ හමුදා මෙහෙයුම් අවසන් කරන බවත්, මෙම ගිවිසුම මගින් පෙනී යන්නේ ඉරානයේ ජයග්‍රහණයක් බවත්ය. ඉරානයේ ඉහළම සියලු හමුදා අණදෙන නිලධාරියා ප්‍රකාශ කර සිටියේ ඇමෙරිකා එක්සත් ජනපදයට පරාජය පිළිගැනීම සහ යටත් වීම හැර වෙනත් විකල්පයක් නොමැති බව මෙම ගිවිසුම හරහා පෙන්වාදී ඇති බවයි. එසේම ඊශ්‍රායලයද එම පරාජය භාරගත යුතු බවත් ඔහු ප්‍රකාශ කර ඇත.

දැන් ඔබ මෙම කතාවේ යම් සන්ධිස්ථානයකට පැමිණ සිටින්නේය. ඇමෙරිකා-ඉරාන යුද්ධ පසුබිම තුළදී මෙසේ



හෙළිවන සත්‍ය වතගොත කුමක්ද? ලෝකයේ සිටින ප්‍රකට සහ ප්‍රවීණ දේශපාලනික සහ යුද විශ්ලේෂකයන් මෙන්ම විචාරකයන් මෙම සිදුවීම් ගැන සුවිශේෂ මත රැසක් ප්‍රකාශ කර ඇත. ඔවුන් බහුතරයක් ප්‍රකාශ කර ඇත්තේ ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා ඇමෙරිකා-ඉරාන යුද්ධයෙන් පරාජයවී ඇති බවත්, එසේම නව ගිවිසුම හරහා පෙන්වා සිටින්නේ ඔහු යුද්ධයේ පරාජය භාරගෙන ඇති බවත්ය. එම සුවිශේෂ විශ්ලේෂණයන් එක්තැන් කළ විට මෙවැනි අර්ථකථනයක් ගෙනහැර දක්වයි.

'ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඇමෙරිකා-ඉරාන යුද්ධයෙන් පරාජයට පත්වූයේ ඔහුගේ මූලික උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීමට අපොහොසත් වීම, කොංග්‍රස් අනුමැතිය ලබාගැනීමට අරගල කිරීම සහ දැඩි දේශීය හා ජාත්‍යන්තර ප්‍රතිවිපාකවලට මුහුණ දීම හේතුවෙනි. ජනාධිපති ට්‍රම්ප් නිසි සැලසුමක් නොමැතිව යුද්ධය ආරම්භ කළේය. හෝමුස් සමුද්‍ර සන්ධිය වසාදැමීමට ඉරානයට ඇති හැකියාව පිළිබඳ බුද්ධි අංශ අනතුරු ඇඟවීම් නොසලකා හැරියේය. ගෝලීය සහචරයන්ගේ විරෝධය නොසලකා හැරියේය. මිලිටරි මැදිහත්වීම සහ ඉන් පසුව ඇතිවූ ගෝලීය බලශක්ති බාධාවන් හේතුවෙන් ඇතිවන ගෝලීය ආර්ථික පීඩනය මායිම් නොකළේය...'

එම විද්වත් විශ්ලේෂණයන් තවදුරටත් මෙසේ කියා සිටියි. ඒ සඳහා ඔවුන් විවිධ පියවර ගෙනහැර දක්වයි.

'ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ යුද්ධය අවසන් කරන ගිවිසුම සාදරයෙන් පිළිගත හැකි නමුත් ඒ සමගම කටුක සත්‍යයන්ද ගෙන එයි. ඔහු මෙම යුද්ධය සිදුකළේ නීතියට පටහැනිව නොසැලකිලිමත් ලෙස තමන්ගේම හිතුමනාපයටය. රටක නායකයකුට එවැන්නක් සිදුකළ නොහැකිය. මේ නිසා ඇමෙරිකාව මිලිටරිමය වශයෙන්ද රාජ්‍යතාන්ත්‍රිකව සහ ආර්ථික වශයෙන්ද දුර්වල විය. එසේම එය ඔහුට සහ ඔහු නායකත්වය දෙන ජාතියටද නින්දාසහගත පරාජයකි. ගැටුමේ ප්‍රතිඵලය මගින් ප්‍රධාන උපායමාර්ගික ප්‍රතිවිපාක කිහිපයක්ම මතු කරයි. යුද්ධය සඳහා ඩොලර් බිලියන සිය ගණනක සම්පත් විනාශ කර දැම්මේය. එහෙත් නොවිසඳුණු න්‍යෂ්ටික ගැටලු ගැන තත්ත්වය එසේම පැවැතුණේය. එසේම මුළුමහත් ලෝකයේම ආර්ථික අස්ථාවරත්වයට හේතු විය. එම තත්ත්වය දිනෙන් දින උත්සන්න වූවා මිස විසඳුමක් වම සිදුව නැත. යුද්ධය නිසා ගෝලීය සන්ධානවලට දැඩි ලෙස හානි සිදුවිය. මේ නිසා යුරෝපීය සහ ගල්ෆ් සහචරයන් ට්‍රම්ප් පාලනය විචාරයට ලක් කළේය.

මේ නිසා රාජ්‍යතාන්ත්‍රික අර්බුද සහ අසාර්ථකත්වයන් රැසක් ඇති විය. යුද්ධය ඇතිවූ කාලයේ සිටම ඇමෙරිකානු කොංග්‍රසය, සෙනෙට් සභාව, ශ්‍රේෂ්ඨාධිකරණය ට්‍රම්ප්ගේ ප්‍රතිපත්ති සඳහා විරුද්ධත්වය දැක්වීය. එය ඔහු මුහුණ දුන් විශාලතම අර්බුදයක්ද විය...'

ඇමෙරිකානු කොංග්‍රසය (පාර්ලිමේන්තුව) ජනාධිපති ට්‍රම්ප්ට විරුද්ධ වන්නේ ක්‍රමවේද කිහිපයක් හරහාය. ව්‍යවස්ථාදායක බාධක, භාණ්ඩාගාරයේ මූල්‍යමය බලය, කොංග්‍රස් මණ්ඩල විභාග සහ නීතිමය අභියෝග ප්‍රතිසන්ධාන පනත් කෙටුම්පත්, ඡන්ද හා මත විමසීම්, සිතාසි බලය මෙන්ම නීතිමය අභියෝග සහ නඩුහබ මෙම ක්‍රියාවලීන් වෙයි. එසේම ඇමෙරිකා එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රධාන වශයෙන් ඩොනල්ඩ් ට්‍රම්ප්ට විරුද්ධ වන්නේ බලතල බෙදීම දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සහ විධායකයේ සීමාව ඉක්මවා යෑම සීමා කිරීමෙනි. ඔහුගේ ඒකපාර්ශ්වික උත්සාහයන් අධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත. මෙහිදී විදේශ ප්‍රතිපත්ති සහ යුද බලතල ගැන ශ්‍රේෂ්ඨාධිකරණය දැඩි අවධානය යොමුකර තීන්දු තීරණ සහ නියෝග පනවයි. මෙයට අමතරව සෙනෙට් සභාවද ජනාධිපති ට්‍රම්ප්ගේ යුදමය තීන්දුවලට එරෙහි වූයේය. නිදසුනක් වශයෙන් යෝජිත ඩොලර් බිලියන 1.8ක 'ආයුධ විරෝධී අරමුදලට' එරෙහිව සෙනෙට් සභාව කැරැලි ගැසුවේය. මෙය දැන් තාවකාලිකව අත්හිටුවා ඇත.

යුද්ධයෙන් පැරදුණු ඇමෙරිකානු ජනාධිපතිවරයාගේ කතාව අතරතුරදී තවත් විශේෂ පුවතක්ද හෙළිවෙයි. එනම් පසුගියදා පවත්වන ලද ප්‍රකට AP-NORC නමැති මහජන මත විමසීමේදී ඇමෙරිකානු ජනතාවගෙන් 56%ක්ම ට්‍රම්ප් ප්‍රතිපත්තිවලට විරුද්ධ වී ඇති අතර, සහාය දක්වා ඇත්තේ 36%ක ප්‍රමාණයක් පමණි. 8%ක ප්‍රමාණයක් පමණක් මධ්‍යස්ථ මත දරා ඇත. මෙම ප්‍රතිඵල ඩොනල්ඩ් ට්‍රම්ප් ලැබූ මහා පරාජයකි. මෙම යුද්ධයෙන් ගොඩ ගියේ චීනය හා රුසියාව පමණි.

ප්‍රියන්ත හෙට්ටිගේ

---

# 3000කට අධික ට්‍රැක්ටර් රථ සවිබල ගැන්වූ බ්‍රවුන්ස් ට්‍රැක්ටෙක් සේවා කඳවුර

අපේ රටේ සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය නවීන තාක්ෂණයෙන් බලගැන්වීමේ පුරෝගාමියෙක් ලෙස බ්‍රවුන්ස් සමාගමට ඇත්තේ සාඩම්බර උරුමයක්. එම කාර්යභාරය ජාතික මෙහෙවරක් සේ සලකමින් නව්‍ය නිෂ්පාදන හා සේවාවන් සමග ගොවි අවශ්‍යතා ඉටුකිරීමට බ්‍රවුන්ස් කෘෂි අංශය නිරතුරුවම කැපවී සිටිනවා.

එවන් යුග මෙහෙවරක තවත් එක් විප්ලවීය පියවරක් ලෙස බ්‍රවුන්ස් ට්‍රැක්ටෙක් සේවා කඳවුර හඳුන්වා දිය හැකියි. පරම්පරා ගණනාවක් පුරා අපේ රටේ ගොවීන්ට ලොව උසස්ම ට්‍රැක්ටර් නිෂ්පාදන හඳුන්වා දුන් බ්‍රවුන්ස් කෘෂි අංශයට ට්‍රැක්ටර් පිළිබඳ ඇත්තේ විශේෂඥ ඥානයක්. ශ්‍රී ලාංකීය පොළොවට, කුඹුරට ගැළපෙන තාක්ෂණික වෙනස්කම්, අපේ දේශගුණයට ඔරොත්තු දිය හැකි සවි ශක්තිය වගේම අපේ ගොවි මහතුන්ටම සුවිශේෂ වූ අවශ්‍යතා ආදී තවත් බොහෝ සාධක පිළිබඳ



ප්‍රවීණත්වයක් බ්‍රවුන්ස් කෘෂි අංශය සතුයි. මේ කාරණා නිසාම දශක ගණනක් තිස්සේ දිවයින පුරා බ්‍රවුන්ස් සමග විශ්වාසයෙන් බැඳී සිටින ට්‍රැක්ටර් පාරිභෝගික ජාලය අතිමහත්.

උසස් තත්ත්වයේ ට්‍රැක්ටරයක් ලබාදීමෙන් පමණක් ගොවීන්ගේ අවශ්‍යතා ඉටුවන්නේ නැහැ. ට්‍රැක්ටරයක් වැනි රළු භාවිතයක් සහිත කෘෂි තාක්ෂණික උපකරණයකට අලෙවියෙන් පසු සේවාව ඉතාම වැදගත්. බ්‍රවුන්ස් ට්‍රැක්ටෙක් සේවා කඳවුර නම් සංකල්පය බිහිවන්නේ එම සුවිශේෂ අවශ්‍යතාවය හොඳින්ම හඳුනාගත් නිසයි.

---



මවු නායකත්ව සමුළුව 2026 හිදී (Mom Leaders Conference 2026) ලංකාවේ මවුවරුන්ට වඩාත්ම හිතකර සේවා ස්ථාන 10 අතරට DFCC බැංකුව තේරී පත්වී ඇත. 'Parenthood Global' සංවිධානය විසින් සංවිධාන කරන ලද මෙම ඇගයීම මගින්, රැකියා නියුක්ත මවුවරුන්ට වෘත්තීයමය වශයෙන් වර්ධනය

# මවුවරුන්ට හිතකර DFCC බැංකුව

වීමට, නායකත්වය දීමට සහ සාර්ථක වීමට අවශ්‍ය පසුබිම සකස් කර දීමට DFCC බැංකුව දක්වන අඛණ්ඩ උනන්දුව මැනැවින් පැහැදිලි වෙයි.

රැකියාවේ දියුණුව මෙන්ම පවුලේ වගකීම් ද එක හා සමානව සමබරව පවත්වා ගැනීමට කාන්තාවන්ට සහාය වන, සැමට එකසේ සලකන සේවා පරිසරයක් නිර්මාණය කිරීමට DFCC බැංකුව ගන්නා උත්සාහය මෙම ඇගයීමට හේතු වී ඇත. එමෙන්ම, සේවකයන්ගේ සුභසාධනය සහ සැමට සමාන අවස්ථා ලබාදීමට මුල් තැන දෙන, ලංකාවේ ප්‍රමුඛ පෙළේ ආයතනයක් ලෙස DFCC බැංකුව තබා ඇති විශ්වාසය මේ හරහා තවදුරටත් තහවුරු වෙයි.

---

## ජීවිත රක්ෂණයේ පෙරළියක්

# ලංකාවේ පළමු වරට රක්ෂණයේ වයස් සීමාව අවුරුදු 80ක් කළ JANASHAKTHI LIFE

මෙරට රක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම සමාගමක් මෙන්ම JXG (ජනශක්ති සමූහ ව්‍යාපාරය) හි ප්‍රමුඛතම සන්නාමයක් වන Janashakthi Life ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ පෙරළියක් සිදුකරමින් වයස් සීමාව සම්බන්ධ සුවිශේෂ වෙනසක් හඳුන්වා දී තිබේ. ඒ අනුව මෙතෙක් ජීවිත රක්ෂණ ලබාගැනීමට නොහැකි වූ ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසකට එම අවස්ථාව උදාවනු ඇත. මෙය



ජනතාවට ඔවුන්ගේ ජීවිතය පුරාම මූල්‍යමය රැකවරණය ලබාදීම සඳහා Janashakthi Life ගත් වැදගත් හා කාලීන පියවරක් ලෙස හැඳින්විය හැකි වේ.

මෙම වෙනස මගින් Janashakthi Life මෙරට ප්‍රථම වරට ජීවිත රක්ෂණ ලබාගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 65 - 70 සිට අවුරුදු 80 දක්වා දීර්ඝ කර ඇත. මීට අමතරව මෙම රක්ෂණය මගින් වයස අවුරුදු 90 දක්වා ජීවිත ආවරණයක් සමග කල්පිරීමේ ප්‍රතිලාභ හිමි වේ. මෙය මෙරට දීර්ඝකාලීන මූල්‍යමය රැකවරණය සහ මූල්‍ය සේවා අඛණ්ඩතාව සම්බන්ධ සුවිශේෂ සන්ධිස්ථානයක් ලෙස හැඳින්විය හැක.

BUSINESS TALK

---

# යූනියන් ඇෂුවරන්ස් සම්පත් බැංකුව LIFE LEADS විශිෂ්ටයන් අගයයි

ශ්‍රී ලංකාවේ දීර්ඝතම කාලයක් පුරා ක්‍රියාත්මකව පවතින පෞද්ගලික ජීවිත රක්ෂණ සමාගම වන යූනියන් ඇෂුවරන්ස් විසින් පසුගියදා කොළඹ Cinnamon Life හිදී Sampath Bank Life Leads Annual Awards 2025 උළෙල පවත්වනු ලැබුවේ යූනියන් ඇෂුවරන්ස් සහ සම්පත් බැංකුව යන ආයතන දෙකේම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ බැංකුවේ දීප-ව්‍යාප්ත ශාඛා ජාලය නියෝජනය කළ සේවක පිරිසද සහභාගි කරවා ගනිමිනි. මෙම වැඩසටහන මඟින් ආයතන දෙකෙහි Life Leads හවුල්කාරීත්වය සාර්ථක ලෙස අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට උපකාරී වන දෛනික පාරිභෝගික කටයුතු ඉටුකරන ශාඛා කාර්යමණ්ඩලිකයන්ගේ විශිෂ්ට දායකත්වයන් අගයනු ලැබිණි.

පොදු දැක්මක් මත ගොඩනගා ඇති යූනියන් ඇෂුවරන්ස් සහ සම්පත් බැංකුව අතර හවුල්කාරීත්වය මෙරට වඩාත්ම ව්‍යාප්ත බැංකුකරණ ජාල අතරින් එකක්




ඔස්සේ ශ්‍රී ලංකාව පුරා ජීවිත රක්ෂණ විසඳුම් ලබාග ැනීමේ පහසුව පුළුල් කිරීමට අඛණ්ඩව කටයුතු කරයි. මේ වනවිට බැන්ක්ඇෂුවරන්ස් හවුල්කාරීත්ව වැඩසටහන් අතර ස්ථාපිත සන්ධිස්ථානයක් වන Life Leads වාර්ෂික සම්මාන උළෙල මගින් මෙම හවුල්කාරීත්වයේ අඛණ්ඩ සාර්ථකත්වය පසුපස සිටින පිරිස ඇගයීම උදෙසා ආයතන දෙක විසින් දරනු ලබන සාමූහික කැපවීම පිළිබිඹු වෙයි.

---

සියැට් කැලණි හෝල්ඩින්ග්ස් සමාගම සිය අග්‍රගන්‍ය අලෙවිසල් ජාලය පුළුල් කරමින් කොළඹ 6, හැව්ලොක් පාරේ අංක 255 දරන ස්ථානයේ පිහිටි ඔලිම්පික් ටයර් හවුස්හි නව Shop-in-Shop (SIS) අලෙවිසලක් විවෘත කර ඇත.

හැව්ලොක් සිටි සාප්පු සංකීර්ණය ඉදිරිපිට උපායමාර්ගිකව පිහිටා ඇති මෙම අලෙවිසල, වාහන හිමියන්ට නවීන පන්නයේ, පාරිභෝගික හිතකාමී පරිසරයක් තුළ සියැට් හි පූර්ණ පරාසයක විහිදි ටයර් ආශ්‍රිත සේවාවන් ලබාගැනීමට පහසු ආකාරයේ ප්‍රවේශයක් ලබාදෙයි. මෙම අලෙවිසල හරහා නයිට්‍රජන් සහ වායු පිරවීම, රෝද තුලනය කිරීම හා සකස් කිරීම ඇතුළු ටයර් ආශ්‍රිත සේවාවන් රාශියක් සමඟින් ආකර්ෂණීය වට්ටම් යටතේ පුළුල් පරාසයක සියැට් ටයර් සපයයි. තවද මෙම අලෙවිසල තුළ, තම වාහන නඩත්තු කටයුතු සිදුකරගන්නා අතරතුර විවේකීව සිටීමට සියැට් ගැනුම්කරුවන් සඳහාම වෙන් වූ සුවපහසු විවේකාගාරයක් ද ඇත.

සියැට් දියත් කරන ලද මෙම නවමු Shop-in-Shop (SIS) සංකල්පය සිල්ලර වෙළෙඳාමේ නව මාවතක් විවර කළ මුලපිරීමක් වන අතර එහිදී දැනට පවතින බහු සන්නාම අලෙවි නියෝජිත පරිශ්‍රයක් තුළ සියැට් සන්නාමයේ ටයර් සඳහාම වෙන් වූ ප්‍රදේශයක් ස්ථාපිත කරයි. සුවිශේෂ දෘශ්‍යමය සියැට් අවකාශයක් නිර්මාණය කිරීමෙන් මෙම සංකල්පය හරහා වෙළෙඳසල් තුළ

# සියැට් අලෙවිසලක් හැව්ලොක් පාරටත්




පාරිභෝගික අත්දැකීම උසස් කරයි. සන්නාමයේ අග්‍රගන්‍ය අනන්‍යතාව ශක්තිමත් කරමින් අලෙවි නියෝජිත හවුල්කරුවන්ට ද ප්‍රතිලාභ හිමිකර දෙන, මනාව සකස් කර ඇති පරිසරයක් තුළ සියැට් නිෂ්පාදන ඉදිරිපත් කිරීමට මෙමගින් හැකියාව ලබා දෙයි.



# තාත්තා හිටියා නම් ඔහොම කතා කරන්න දෙන්නේ නෑ

# ජවිපෙටත් අමතක වුණු ජවිපෙ නායකයා ගැන ජවිපෙ නායක විජේවීරගේ පුත් උවිඳු තැබූ සටහන



## රෙජී අංකල් නැතිවෙලා අවුරුදු 10යි

**දේශපාලන අඳුරු යුගයක, 1988-89 පසු අළු හා දූවිලි අතර වැටී තිබූ ජනතා විමුක්ති පෙරමුණ නැවත ගොඩනැගීමට නායකත්වය දුන් අසමසම සංවිධායකයා වූයේ සෝමවංශ අමරසිංහ මහතාය. 1994 දී ජවිපෙ නැවත දේශපාලන වේදිකාවට ගෙන එමින් එය රටේ ප්‍රබල දේශපාලන බලවේගයක් බවට පත් කළේ ඔහුගේ කැපවීම, ධෛර්යය සහ දුරදක්නා නායකත්වය මගිනි.**

එමෙන්ම බෙදුම්වාදී එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා රටේ ජාතික බලවේග පෙළගස්වා ජනමතය ගොඩනැගීමටද ඔහු වැදගත් කාර්යභාරයක් ඉටුකළේය.

අද දේශපාලන මතභේද කුමක් වුවත්, අභියෝග හමුවේ නොසැලී තම දේශපාලන විශ්වාස වෙනුවෙන් ජීවිතය කැප කළ නායකයකු ලෙස සෝමවංශ අමරසිංහ මහතා ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් හිමි කරගෙන සිටී.

දේශපාලනයෙන් ඔබ්බට, සරලත්වය, මනුෂ්‍යත්වය සහ ආදරණීය ඇසුර නිසා ඔහු සමීපව ඇසුරු කළ බොහෝ දෙනාගේ හදවත් තුළ අදත් ජීවමාන චරිතයකි. ඒ නිසාම අපට තාත්තා සමග උලපනේ ගෙවුණු කාලයේ සිටම අවසානය දක්වා සැමවිටම ඔහු රෙජී අංකල් විය.

'මා හට අවසන් වරට ඔහු හමුවූයේ මා රුසියාවේ අධ්‍යාපනයට යන බව පැවසීමට පැලවත්ත පක්ෂ කාර්යාලයට ගිය මොහොතේය. මා යාමට නියමිත රුසියාව පිළිබඳ, ලෝක දේශපාලනය පිළිබඳ සහ අනාගතය පිළිබඳ අපි සුහද කතාබහක නිරතව සිටියෙමු. එහිදී කසකස්තානය යන රටේ නම මා ඉංග්‍රීසි භාෂාවේ හුරුවට උච්චාරණය කළ විට, එය නිවැරදි නොවන බව ඔහු පැවැසීය. අදටත් එය මා මතකයේ

> **පියෙකු මෙන් ඔහු මා හට ලබාදුන් එම අවවාද හා උපදෙස් මම මගේ මතකයේ තැන්පත් කර ගතිමි. මාගේ මතකය නිවැරදි නම්, රෝහණ විජේවීරයන්ගේ පුත්‍රයකු ලෙස මා පැලවත්තේ පක්ෂ කාර්යාලයට අවසන් වරට පා තැබුවේ ද එදිනය.**

පවතින්නේ, මා විමතියට පත්කරමින් ඔහු රුසියන් බසින් සැකසුණු සිතියමක් ගෙන මා ඉදිරියේ තබා එම රටේ නම නිවැරදිව උච්චාරණය වන්නේ මෙලෙස බව පෙන්වා දුන්නේ.

එම සංවාදය අතරතුර, ඉතාමත් අවධාරණයෙන් ඔහු මා හට පැවසූ තවත් වදන් කිහිපයක් අදටත් අමතක කළ නොහැක.

'තාත්තා හිටියා නම් ඔහොම කතා කරන්න ඉඩ තියන්නේ නැහැ.'

එදා එම වදන්වල ගැඹුර මට සම්පූර්ණයෙන් වැටහුණේ නැත. නමුත් පසුකාලීනව මට තේරුම් ගියේ, තාත්තා විසින් කිසිදු සුළු වරදකටවත් ඉඩ නොතබන, ඉස්පිල්ලක් හෝ පාපිල්ලක් වැරදීමටවත් ඉඩ නොදෙන විනයගරුක දේශපාලන සංස්කෘතියක් සහ මිනිසුන් පිරිසක් නිර්මාණය කර තිබූ බවය. නිවැරදිව සිතන, නිවැරදිව ක්‍රියාකරන, අනාගතය දකිමින් වගකීමෙන් කටයුතු කරන මිනිසුන් බිහිකිරීම ඔහුගේ අපේක්ෂාව වී තිබිණි.

මා හට ඔහු අවසන් වරට දුන් උපදෙස වූයේ ද ඉතා සරල නමුත් බලවත් එකකි.

'කුමන තත්ත්වයක් යටතේ හෝ උපාධි සහතිකය අතට නොගෙන ලංකාවට ආපහු එන්න එපා.'

පියෙකු මෙන් ඔහු මා හට ලබාදුන් එම අවවාද හා උපදෙස් මම මගේ මතකයේ තැන්පත් කර ගතිමි. මාගේ මතකය නිවැරදි නම්, රෝහණ විජේවීරයන්ගේ පුත්‍රයකු ලෙස මා පැලවත්තේ පක්ෂ කාර්යාලයට අවසන් වරට පා තැබුවේ ද එදිනය.

ඉන් අනතුරුව මා රුසියාවේ අධ්‍යාපනය ලබමින් සිටියදී ඔහු ජනතා විමුක්ති පෙරමුණ අතහැර ගියේය. ඒ සමගම, ඔහු නායකත්වයේ සිටින විට අපගේ පවුලට ලබාදෙන බවට පොරොන්දු වූ නිවස සහ කඳවුරෙන් නිදහස ලබාගැනීම සම්බන්ධයෙන් පක්ෂයත් අපගේ පවුලත් අතර විසඳාගත නොහැකි අර්බුදයක් මතුවිය.

කෙසේ වෙතත්, මාගේ පළමු උපාධි සහතිකය රැගෙන නැවත ලංකාවට පැමිණෙන විට, තාත්තාගේ මතකයන්, ඔහුගේ ගුණ සුවඳ හුරු ජවිපෙ නායකත්වයේ සිටි අවසන් මිනිසා ලෙස මතකයන් ඉතිරි කොට, ඔහුද මෙලොව හැර ගොස් තිබිණි.

ඔබට විප්ලවීය උත්තමාචාරය...

*උවිඳු විජේවීර*





# සංගීත්ගේ ඩොලර් මිලියන 23ක කතාව අලි බොරුවක්

# මුදල් නියෝජ්‍ය ඇමැති සංගීත්ව පව කරයි

**ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය සමනය කිරීම සඳහා තම මිතුරන් කණ්ඩායමක් විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 23ක මුදලක් ලංකාවට එවීමට උත්සාහ දැරූ බවටත්, ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා තමාව මුදල් අමාත්‍යවරයා වෙත යොමුකළ බවටත් ජනප්‍රිය ගායන ශිල්පී සංගීත් විජේසූරිය මහතා පසුගිය දිනෙක සිදුකළ ප්‍රකාශය සම්බන්ධයෙන් දෙරණ රූපවාහිනියේ 360 දේශපාලන සංවාදයේදී නියෝජ්‍ය මුදල් අමාත්‍ය අනිල් ජයන්ත මහතාගෙන් මාධ්‍යවේදී කලිඳු කරුණාරත්න විමසා සිටියා. එහිදී නියෝජ්‍ය අමාත්‍යවරයා පවසා සිටියේ කිසිදු අවස්ථාවක සංගීත් විජේසූරිය මහතා හෝ වෙනත් කිසිවකුත් එවැන්නක් සම්බන්ධයෙන් තමන් සමග සාකච්ඡා නොකළ බවයි. පහත පළවන්නේ දෙරණ 360 සංවාදයෙන් උපුටාගත් එම සාකච්ඡාවයි.**

**ප්‍රශ්නය**

අවසාන සති දෙක තුළ වගේ අපි බොහොම ආදරේ කරන ජනප්‍රිය කලාකරුවෙක්, සංගීත් විජේසූරිය මහත්මයා සඳහන් කළා එක්තරා සම්මුඛ සාකච්ඡාවක, ඔහුගේ මිතුරන් එකතු වෙලා ඩොලර් මිලියන 23ක මුදලක් ලංකාවට ගේන්න ඉදිරිපත් වුණා කියන කාරණාව. එහිදී ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා වෙත යොමුකළා කියලා කිව්වාම අපි තේරුම් ගත්තේ බොහෝ විට ඔබට යොමුකරන්න ඇති කියලා, ඔබ මුදල් රාජ්‍ය අමාත්‍යවරයා නිසා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තියෙන කොන්දේසි එක්ක එවැනි ආධාරයක් ලංකාවට කරන්න බැරි බව කිව්වේ ඔබද?

**නියෝජ්‍ය මුදල් අමාත්‍ය අනිල් ජයන්ත**

නෑ, ඇත්තටම මම ඔහුව කලින් හම්බවෙලා තියෙනවා අපේ ඡන්ද ව්‍යාපාරයට කලින් යම් යම් රැස්වීම්වලදී දැකලා තියෙනවා. ඊට පස්සේ අපි මුණගැහිලා නෑ. නමුත් මම දැක්කා සමාජ මාධ්‍යවල ඉතාමත් වැරදි ප්‍රකාශයක් ඉදිරිපත් කළා, නොමග යවන ප්‍රකාශයක්. ඇත්තටම වැරදියි ඒ ප්‍රකාශය, මම කියපු ප්‍රකාශයක් නෙමෙයි. ඉතින් අර සංගීත් විජේසූරිය මහත්මයා මොකක්ද කිව්වේ කියන එක එතුමාගෙන් අහන්න ඕනේ මොකක්ද වෙච්ච සිද්ධිය කියලා. ඒක තමයි ඇත්ත තත්ත්වය. නමුත් සමාජ මාධ්‍යවල අපි නොකරපු ප්‍රකාශ ගෙනියනවා අපි කළා කියලා. සමහර දේවල් වැරදි ප්‍රකාශ ඉදිරිපත් කරලා, ඕක විතරක් නෙමෙයි තවත් කීපයක් මම දැක්කා ණය සම්බන්ධයෙන්.

**ප්‍රශ්නය**

ඒ කියන්නේ කිසිම අවස්ථාවක ඩොලර් මිලියන 23ක ආධාරයක් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ගැනීමට ඔහුගේ මිතුරන් කිසිම අවස්ථාවක ඔබව හමුවුණේ නැද්ද?

**නියෝජ්‍ය මුදල් අමාත්‍ය අනිල් ජයන්ත**

නැහැ, ඔහුගේ මිතුරන් හමුවුණෙත් නැහැ, ඔහුව හම්බුණෙත් නැහැ.

**ප්‍රශ්නය**

එතකොට ජනාධිපතිතුමා මුදල් ඇමැතිතුමා වෙත යොමුකරනවා කිව්වට පස්සේ අපි දන්නේ නැහැ මුදල් විෂයට සම්බන්ධ වෙනත්....?

**නියෝජ්‍ය මුදල් අමාත්‍ය අනිල් ජයන්ත**

එතුමාගෙන් පොඩ්ඩක් අහලා බලන්න. සමහර විට කාට හරි කතාබහ කරන්න කිව්ව එකක්ද, එතුමා ඇත්තටම කිව්ව එකක්ද... ලයිව් වැඩසටහනක නේද කිව්වේ?

**ප්‍රශ්නය**

සම්මුඛ සාකච්ඡාවක අපේ සහෝදර මාධ්‍යවේදියෙක් සමග.

**නියෝජ්‍ය මුදල් අමාත්‍ය අනිල් ජයන්ත**

මට කියන්න තියෙන්නේ මම ඕක කතා කළේ නෑ එහෙම දෙයක්. ඉතින් ඔහුගෙන් අහන්න ඕනේ. හැබැයි අර සෝෂල් මීඩියාවල යන ප්‍රවෘත්තිය සම්පූර්ණයෙන්ම වැරදි එකක්.

**ප්‍රශ්නය**

විශේෂයෙන්ම මම ඒක ඇහුවෙත් බොහෝ දෙනෙක් අහලා තිබුණා ඩොක්ටර් අනිල් ජයන්තගෙන් මේක අහන්න කියලා. ඒ නිසා මම ඇහුවේ ඇමැතිතුමා.

**නියෝජ්‍ය මුදල් අමාත්‍ය අනිල් ජයන්ත**

ගොඩක් දේවල් මා සම්බන්ධයෙන් මම කරපු නැති ප්‍රකාශ යනවා.

*චානක ලියනගේ*


GovPay mCash
Cash in a Flash

## රථවාහන දඩ සහ රජයේ ගෙවීම්වලට SLT-MOBITEL MCASH

ශ්‍රී ලංකාවේ පුරෝගාමී ජංගම මුදල් සේවාව වන SLT-MOBITEL mCash, රජයේ ආයතන වෙත ගෙවීම් සිදුකිරීමේ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීම සහ නවීකරණය කිරීම සඳහා නිර්මාණය කර ඇති රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව වන GovPay ඒකාබද්ධ කිරීම කරන ලද බව පසුගියදා නිවේදනය කරන ලදී.

මේ ඔස්සේ රාජ්‍ය ආයතන වෙත සිදුකරන ගෙවීම්, රථවාහන දඩ මුදල් සහ පළාත් පාලන ආයතන සඳහා ගෙවිය යුතු බදු මුදල් ඇතුළුව රජය සම්බන්ධ ගෙවීම් 4,000කට අධික සංඛ්‍යාවක් සඳහා mCash සේවාව හරහා GovPay වෙත ගෙවීම් කිරීමට හැකි වනු ඇත. mCash යනු රටේ විශාල පිරිසක් දැනටමත් භාවිත කරන සේවාවක් වන බැවින් මෙය රටේ ඩිජිටල් ආර්ථික සැලසුම් වේගවත් කිරීමට දායක වන පියවරක්ද වනු නිසැකය. එමෙන්ම මෙය රාජ්‍ය සේවාවන් නවීන ලෝකයට ගැළපෙන ආකාරයට වැඩිදියුණු කිරීමක් වන අතර, වැඩි පිරිසක් වෙත මූල්‍ය සේවාවන් සමීප කරවීමක්ද වේ. මෙය පුරවැසියන්, රජය සහ තාක්ෂණය සහසම්බන්ධ කරමින්, එදිනෙදා සිදුකරන සාමාන්‍ය ගෙවීම් රටේ ඵලදායීතාවට, අන්තර්කරණයට සහ විශ්වසනීයත්වයට දායක වන ක්‍රියාවලියක් බවට පත්කරන සුවිශේෂ තීරණයක් ලෙස හැඳින්විය හැකි වේ.

## ONLINE භාණ්ඩ අලෙවියේ ගැටලුවලට විසඳුම MO MARKETPLACE



ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායිකාවන්ට මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ භාණ්ඩ අලෙවි කිරීමේදී මුහුණ දීමට සිදුවන ආරක්ෂාව සහ පෞද්ගලිකත්වය පිළිබඳ ගැටලුවලට සාර්ථක විසඳුම් ලබාදීමට 'MO Marketplace' ජංගම දුරකතන යෙදවුම (App) සමත්ව ඇත.

2024 ජුනි මාසයේදී ආරම්භ කරන ලද මෙම වේදිකාව, මෙරට සාම්ප්‍රදායික ඩිජිටල් වෙළෙඳපොළ තුළ කාන්තාවන් මුහුණ දෙන නොකියූ අවදානම් රැසක් මුළුමනින්ම තුරන් කර තිබේ. මෙහිදී ගැනුම්කරුවන්ට සහ අලෙවිකරුවන්ට තමන්ගේ පෞද්ගලික දුරකතන අංක හෝ විස්තර හුවමාරු කරගැනීමකින් තොරව ගනුදෙනු අවසන් කළ හැකිය. භාණ්ඩය ගැනුම්කරු අතට පත්වන තෙක් ගෙවීම් ආරක්ෂිත 'භාරකාරත්ව ගිණුමක' (Escrow Account) රඳවා තබාගන්නා අතර, භාණ්ඩ එකතු කිරීම සහ බෙදාහැරීම (Delivery) මුළුමනින්ම සිදු කරනු ලබන්නේ MO සමාගම විසිනි.

ගතවූ මාස 18 තුළ මෙම යෙදවුම භාගත කිරීම් (Downloads) 45,000ක් සහ ලියාපදිංචි පරිශීලකයින් 14,000ක් ලබාගනිමින් ඉහළ ප්‍රගතියක් පෙන්වා ඇත. රෙදිපිළි, විලාසිතා සහ ගෘහස්ථ උපකරණ අලෙවිය මෙහි ප්‍රමුඛ වන අතර, ඉන් බහුතරයක් මෙහෙයවනු ලබන්නේ කාන්තාවන් විසිනි. අනෙකුත් වේදිකා 15% සිට 30% දක්වා ඉහළ කොමිස් මුදලක් අයකරද්දී, MO Marketplace අය කරනු ලබන්නේ 10%ක අවම කොමිසමකි.

## හදිසි ආපදා මෙහෙයුම්වලට නෙදර්ලන්තයෙන් ආ HOLMATRO RESCUE

### හඳුන්වා දුන්නේ MARLBO TRADING COMPANY



ශ්‍රී ලංකාවේ හදිසි ආපදා මෙහෙයුම් ක්‍රියාන්විත කාර්යක්ෂමව සිදුකිරීම සහ ආපදා ප්‍රතිචාර හැකියාවන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින්, නෙදර්ලන්තයේ පිහිටි ලොව ප්‍රමුඛතම Rescue Solutions නිෂ්පාදකයකු වන Holmatro Rescue සන්නාමය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට Marlbo Trading Company සතුටින් නිවේදනය කරයි.

ශ්‍රී ලංකාව තුළ සෑම වසරකම මාර්ග අනතුරු, ගිනි අනතුරු, කර්මාන්තශාලා හදිසි අවස්ථා, ගොඩනැගිලි කඩාවැටීම් සහ ස්වභාවික ආපදා හේතුවෙන් විශාල පිරිසක් මියයන අතර, තවත් දහස් ගණනක් තුවාල ලබති. මෙම අවස්ථාවන් බොහොමයකදී ජීවිත බේරාගැනීම සඳහා ඉතා වේගවත් සහ කාර්යක්ෂම ගලවා ගැනීමේ මෙහෙයුම් සිදුකිරීම අත්‍යාවශ්‍ය වේ.

හදිසි අවස්ථාවකදී සෑම තත්පරයක්ම වටිනා වේ. වාහනයක සිරවී සිටින පුද්ගලයකු වෙත ප්‍රවේශ වීම, ගිනිගත් ගොඩනැගිල්ලකට ආරක්ෂිතව ඇතුළු වීම, කඩා වැටුණු ව්‍යුහයක් තුළ සිරවී සිටින පුද්ගලයන් වෙත ළඟාවීම හෝ ආපදා අවස්ථාවකදී වේගවත් ප්‍රතිචාර දැක්වීම වැනි කාර්යයන් සඳහා නවීන Rescue Tools අත්‍යාවශ්‍ය වේ.

## ඩීපෝල් ශ්‍රී ලංකාවට ගෙනා අලුත්ම S05 REEV




ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ නව බලශක්ති වාහන සන්නාමයක් වන ඩීපෝල් ශ්‍රී ලංකා, සිය නවතම Deepal S05 REEV (Range Extended Electric Vehicle) මාදිලිය කොළඹ යූනියන් පෙදෙසේ පිහිටි Deepal ප්‍රමුඛතම 3S ප්‍රදර්ශනාගාරයේදී පසුගියදා අතිඋත්කර්ෂවත් අන්දමින් එළිදැක්වීය.

මෙම අවස්ථාව සඳහා සෙනොක් සමූහයේ සහ Prime EV Automobiles හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, පාරිභෝගිකයන්, මාධ්‍ය නියෝජිතයන්, බැංකු හා මූල්‍ය ආයතන නියෝජිතයන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

නවතම REEV තාක්ෂණයෙන් සමන්විත Deepal S05, විදුලි වාහනයක සියලු වාසි සහ දිගු දුර ගමන් සඳහා අවශ්‍ය විශ්වසනීයත්වය එක් කරමින් ශ්‍රී ලාංකික රියැදුරන්ට නවතම රියැදුරු අත්දැකීමක් ලබාදෙයි. කිලෝමීටර් 1,200කට අධික ඒකාබද්ධ ගමන් පරාසයක් ලබාදෙන මෙම වාහනය, දෛනික භාවිතය මෙන්ම දිගු දුර ගමන් සඳහාද කදිම විසඳුමක් ලෙස හඳුන්වාදී ඇත.

## MOGO MEDIA ACADEMY පළමු ඩිප්ලෝමා ප්‍රදානය BMICH එකේ




ශ්‍රී ලංකාවේ නිර්මාණශීලී වෘත්තිකයන්ගේ මීළඟ පරපුර හැඩගැස්වීමේ ගමනේ සුවිශේෂ සන්ධිස්ථානයක් සලකුණු කරමින්, Mogo Media Academy ප්‍රථම සහ සමාරම්භක ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2026 ජූනි මස 4 වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) නෙළුම් ශාලාවේදී සාර්ථකව පැවැත්විණි.

මෙම උත්සවයේදී ඇකඩමියේ පළමු සහ දෙවැනි ශිෂ්‍ය කණ්ඩායම්වල සුවිශේෂ ජයග්‍රහණ ඇගයීමට ලක්කෙරුණු අතර, එහිදී විවිධ නිර්මාණශීලී සහ මාධ්‍ය ක්ෂේත්‍ර ඔස්සේ සමස්ත සිසුන් 115 දෙනෙකු සහතික පත්‍ර ප්‍රදානය ලැබූහ. මීට සජීවීකරණය (Animation), පරිගණක ක්‍රීඩා නිර්මාණය (Game Development), සංකල්ප රූප කලාව (Concept Art) සහ දෘශ්‍ය ප්‍රයෝග (Visual Effects - VFX) යන ඩිප්ලෝමා පාඨමාලා සාර්ථකව නිම කළ සිසුන් 73 දෙනෙකු මෙන්ම, ගුවන්විදුලි නිවේදනය පිළිබඳ වෘත්තීය පුහුණු සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ සිසුන් 42 දෙනකු ද ඇතුළත් වූහ.

## වෙරළ සුරකින්න ඔස්ට්‍රේලියාවයි ලංකාවයි එක්වෙයි දිසි රැළ 2026




ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපයේ සමුද්‍රීය නිරීක්ෂණ කටයුතු, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීමේ අරමුණින් ඔස්ට්‍රේලියානු දේශසීමා බළකාය සහ ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද ඒකාබද්ධ සමුද්‍රීය ආරක්ෂණ වැඩසටහනක් වන 'දිසි රැළ' එහි අඛණ්ඩ තෙවැනි වසර මේ වසරේදී සනිටුහන් කරයි.

මෙම වැඩසටහන යටතේ පසුගිය වසරවලදී බස්නාහිර සහ දකුණු පළාත් කේන්ද්‍ර කරගනිමින් මහජන දැනුවත් කිරීමේ සහ ප්‍රජා දායකත්ව වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක වූ අතර 'දිසි රැළ 2026' හරහා එම වැඩසටහන් ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාත දක්වා ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත. 'සමුද්‍රීය පරිසරය පිළිබඳ අවධානයෙන් සිටීම' යන තේමා පාඨය පදනම් කරගනිමින් දියත් කෙරෙන 'දිසි රැළ' වැඩසටහන මගින් කලාපීය සමුද්‍රීය ආරක්ෂාව තහවුරු කිරීම, දේශසීමා හරහා සිදුවන සමුද්‍රීය අපරාධ මැඩපැවැත්වීම සහ වඩාත් ආරක්ෂිත සමුද්‍ර කලාපයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ඔස්ට්‍රේලියාව සහ ශ්‍රී ලංකාව අතර ගොඩනගාගෙන තිබෙන අඛණ්ඩ සහයෝගීතාව මැනැවින් ප්‍රදර්ශනය වේ.

## බැංකොක්වලදී SUN SIYAM ජාලයට සම්මාන දෙකක්



බැංකොක් නුවර පැවති International Property Awards Asia Pacific සම්මාන උළෙලේදී ශ්‍රී ලංකාව හා මාලදිවයින කේන්ද්‍ර කරගත් Sun Siyam හෝටල් ජාලය සම්මාන ද්විත්වයකින් පිදුම් ලැබීය. ගෘහ නිර්මාණ ශිල්පය, අභ්‍යන්තර සැලසුම්කරණය සහ නිර්මාණ ක්ෂේත්‍රයම ජාත්‍යන්තරව ඇගයීමට ලක්කරන මෙම සම්මාන උළෙලේදී, මාලදිවයින කේන්ද්‍ර කරගත් Sun Siyam Resorts හෝටල් ජාලයේ Privé Collection එකතුවේ කොටසක් වන ශ්‍රී ලංකාවේ Sun Siyam Pasikudah Resort සහ මාලදිවයිනේ පිහිටි Sun Siyam Iru Fushi යන හෝටල්වල දක්නට ලැබෙන නවීන නිර්මාණ සංකල්ප, අභ්‍යන්තර සැලසුම් ඇතුළු සමස්ත නිර්මාණකරණයම මෙහිදී ඇගයීමට ලක්විය.

මෙම සම්මාන උළෙලේ දී ජයග්‍රාහකයන් තෝරාගනු ලබන්නේ, කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් 80කට අධික සංඛ්‍යාවකින් සමන්විත ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් විසිනි.

## වෙනදා ගියේ විපක්ෂයේ මන්ත්‍රීවරු

# මාලිමා මැතිඇමැතිලාගේ CID පැමිණිලිවලට මොකද වුණේ?

**මාලිමා ආණ්ඩුව තවමත් ඇත්තේ ළදරු අවධියේය. බලය පිහිටුවා මේ කෙටි කාලය තුළ මෙරට වෙන කිසිදු ආණ්ඩුවක මැති ඇමැතිවරු නොකළ තරම් පැමිණිලිවලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ලිපිගොනු පුරවා ඇත. ඒ ඇතැම් පැමිණිලි ගමේ පොලිසියවත් භාරනොගන්නා තරමේ ඒවාය. ඇතැම් ප්‍රශ්න යටපත් කිරීමට මෙන්ම ජනතා අවධානයන් වෙනතකට යොමුකිරීමේ උප්පරවැට්ටියක් ලෙසත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීම මාලිමා ආණ්ඩුවේ ඇතැම් උදවිය විලාසිතාවක් බවට පත්කරගෙන ඇති බවක්ද පෙනෙන්නට ඇති කරුණකි. මාලිමා ආණ්ඩුවේ මැති ඇමැතිවරු ඇතුළු විවිධ පාර්ශ්ව විසින් කළ බොහෝ පැමිණිලි ඒ නිසාම ඇත්තේ හුදෙක් ලියවිල්ලක් බවට පමණක් පත්වය. ඒ ගැන 'මව්රට' සිදුකළ සොයාබැලීමකි මේ.**



### 01. ජනපති අනුර කුමාර දිසානායක

පුද්ගලික රෝහල් ජාලයක ලාංඡනය සහ ලිපි ශීර්ෂ ව්‍යාජ ලෙස භාවිත කරමින්, ජනපතිවරණ සමයේදී එකල ජනාධිපති අපේක්ෂකයකුව සිටි අනුර කුමාර මහතා දැඩි අසනීප තත්ත්වයකින් පසුවන බව හැඟවීමට මෙම ව්‍යාජ ලේඛනය සකසා තිබුණි. එය සමාජ මාධ්‍යවල හුවමාරුවීමත් සමග ඒ ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ගොනුකරනු ලබන්නේ 2024 වසරේ සැප්තැම්බර් මස මුල් සතියේ දිනකදීය. ඒ නීතිඥ සුනිල් වටගල සහ සුනිල් හඳුන්නෙත්ති යන අය විසිනි.

මෙම පැමිණිල්ල විභාග කිරීමෙන් අනතුරුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණය හමුවේ කළ කරුණු දැක්වීම්වලින් අනතුරුව එවකට කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් ලෙස සේවයේ නිරතව සිටි තිළිණ ගමගේ විසින් 2024 නොවැම්බර් 06 වැනි දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නියෝග කළේ මෙම ව්‍යාජ වාර්තාව අන්තර්ජාලයට මුදාහළ 'සුභාෂ්' නමැති ගිණුම් හිමියා ඇතුළු සැකකරුවන් වහාම අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසයි. දැන් එම නියෝගය මෙන්ම පැමිණිල්ලද සිදුකර වසර එකහමාරකට වැඩිය. තවමත් කිසිදු සැකකරුවෙක් අත්අඩංගුවට ගත් බවට තොරතුරක් වාර්තා වන්නේ නැත.



### 02. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය හර්ෂණ නානායක්කාර

පාර්ලිමේන්තු වෙබ් අඩවියේ 'ආචාර්ය' ලෙස යෙදීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍ය හර්ෂණ නානායක්කාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළේ 2024 වසරේ දෙසැම්බර් 16 වැනිදාය. තමන් කිසිම දිනක එවැනි ආචාර්ය උපාධි නාමයක් භාවිත කර නොමැති බවත්, තමන් ඉදිරිපත් කළ ජීවදත්ත පත්‍රිකාවේද එය නිවැරදිව සඳහන් කර තිබූ බවත් සඳහන් කරමින් අමාත්‍යවරයා පැමිණිල්ල කර තිබුණේ තම දේශපාලන ප්‍රතිරූපය අපකීර්තියට පත්කිරීමේ හෝ ජනතා විශ්වාසය බිඳදැමීමේ චේතනාවෙන් යම් අයෙකු මෙම ව්‍යාජ දත්ත ඇතුළත් කර ඇති බවට සැකකරන බව පවසමිනි.

මෙම පැමිණිල්ලට අනුව විමර්ශන ආරම්භ කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පාර්ලිමේන්තු මහලේකම්වරිය, සහකාර මහලේකම්වරයා සහ ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂවරයා ඇතුළු නිලධාරීන් 08 දෙනකුගෙන්ම ප්‍රකාශ සටහන් කරගනු ලැබීය. ඉන් එහාට ඒ ගැන කළ විමර්ශනයක් සොයාග න්නට නැත. මෙම පැමිණිල්ල අවසානයක් නොමැති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇති තවත් ගොනුවක් බවට මේ වන විට පත්ව හමාරය.



### 03.කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති

විදෙස්ගත ශ්‍රී ලංකිකයන් ඉලක්කරගෙන සිය නම හා අස්සන භාවිත කරමින් වට්ස්ඇප් සමූහයක් මගින් සිදුකරනු ලබන මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරනු ලබන්නේ ඉකුත් 2024 වසරේ දෙසැම්බර් 24දාය.

ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තාකර ඇත. ඒ අනුව කළ විමර්ශනවලින් වංචාව සඳහා සම්බන්ධ බැංකු ගිණුම්, දුරකතන අංක සොයාගනු ලැබීය. එම පුද්ගලයාට එරෙහිව ජාත්‍යන්තර පොලිසිය මගින් නිල් නිවේදනයක්ද නිකුත් කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පියවර ගත්තේය. මේ බව නොදත් මෙම සැකකරු ඩුබායි සිට මෙරටට පැමිණෙන අතරතුර අත්අඩංගුවට ගන්නේ ඉකුත් මාර්තු 21දාය.

ප්‍රශ්න කිරීමේදී අනාවරණ වන්නේ සුනිල් හඳුන්නෙත්ති පමණක් නොව, නලින්ද ජයතිස්ස, නියෝජ්‍ය ඇමැති එරංග ගුණසේකර මෙන්ම ප්‍රසිද්ධ භික්ෂූන් වහන්සේ නමක්, මාධ්‍යවේදීන් දෙදෙනෙක්, සංගීතඥයෙක් ඇතුළු සමාජයේ ප්‍රසිද්ධ පුද්ගලයන් 17 දෙනෙක් ලෙස පෙනී සිටිමින් වෙන වෙනම වට්ස් ඇප් සමූහයන් සකස්කරමින් ඔහු ඩුබායි සිට විදේශගත ශ්‍රී ලංකිකයන්ගෙන් මුදල් රැ ස්කරගෙන ඇති බවය.



### 04. ජනමාධ්‍ය නියෝජ්‍ය ඇමැතිනී ආචාර්ය කෞෂල්‍යා ආරියරත්න

සමාජ මාධ්‍ය ජාල ඔස්සේ තමාව ඉලක්ක කරගනිමින් අසත්‍ය සහ ද්වේෂසහගත තොරතුරු මෙන්ම පුද්ගලික අපහාස කිරීම් සම්බන්ධයෙන් කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමැතිවරිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරන්නේ 2024 දෙසැම්බර් 27දාය. මේ සම්බන්ධයෙන්ද විමර්ශන තවමත් අවසන්ව නැති අතර සැකකරුවන්ද අත්අඩංගුවට ගැනීමක් සිදුව නැත.



### 05. පාර්ලිමේන්තු මන්ත්‍රී නිලන්ති කොට්ටහච්චි

තමා සම්බන්ධයෙන් සමාජ මාධ්‍යයේ අපහාසාත්මක ප්‍රකාශයක් සංසරණය වන බව සඳහන් කරමින් ඇය වෙනුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 2024 වසරේ දෙසැම්බර් 31දා පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලබනුයේ ඇගේ නීතිඥ නාමල් රාජපක්ෂය. මේ සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2025 ජනවාරි 03දා සැකකරුවෙක්ද අත්අඩංගුවට ගත්තේය. ඔහු මිල්ලනිය ප්‍රාදේශීය සභාවේ පොහොට්ටුවේ හිටපු මන්ත්‍රීවරයෙකි.

ඇය 2025 වසරේ පෙබරවාරි 20 වැනිදා පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව වෙත පැමිණිල්ලක්ද කර තිබුණාය. ඒ ඇයට පක්ෂය විසින් මාධ්‍ය තහනමක් පනවා ඇති බවට ජාතික පුවත්පතක් විසින් පළකර තිබූ පුවතක් සම්බන්ධයෙනි.



### 06. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ

සමාජ මාධ්‍ය තුළ සිය කීර්තිනාමයට අපහාස වන අයුරින් ව්‍යාජ පුවත් හා විකෘති කළ පුවත් පළ කරන බව සඳහන් කරමින් චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යවරයා වෙනුවෙන් ඔහුගේ මාධ්‍ය ලේකම් විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලබන්නේ 2025 අප්‍රේල් 13දාය. පරිගණක අපරාධ අපරාධ විමර්ශන අංශය මගින් මේ ගැන විමර්ශන පවත්වන බව එකල කියැවුණද මෙතෙක් ඒ සම්බන්ධයෙන් සැකකරුවෙක් අත්අඩංගුවට ගැනීමක් තබා ප්‍රශ්න කිරීමකට ලක්වූ බවක් අනාවරණ වන්නේ නැත. ඒ අනුව මෙම පැමිණිල්ලද හුදෙක් පැමිණිල්ලක් බවට පත්ව ඇත.

මේ අතර නියෝජ්‍ය අමාත්‍යවරයා සමගි ජන බලවේගය පක්ෂයේ ගම්පහ ආසන සංවිධායක වරුණ රාජපක්ෂට එරෙහිව එන්තරවාසියක්ද යොමුකර ඇත්තේ යූටියුබ් නාලිකාවකින් අසත්‍ය සහ අපහාසාත්මක ප්‍රකාශ සිදුකළ බව කියමිනි. එම එන්තරවාසිය යොමුකර ඇත්තේ 2025 වසරේ ඔක්තෝබර් 27දාය.



### 07. පරිසර ඇමැති වෛද්‍ය ධම්මික පටබැඳි

වත්මන් ආණ්ඩුව බලයට පත්වී කෙටි කාලයක් තුළ වන අලින් කිහිප දෙනෙක්ම වෙඩි ප්‍රහාරයන්ට ලක්ව මියයාම මුල්කරගෙන පරිසර ඇමැති වෛද්‍ය ධම්මික පටබැඳි මහතාගේ උපදෙස් මත පරිසර අමාත්‍යාංශයේ ලේකම් කේ.ආර්. උඩුවාවල මහතා විසින් පොලිස්පතිවරයාට 2005 ජූලි 23 වැනිදා පැමිණිල්ලක් යොමුකරමින් විමර්ශනයක් ඉල්ලා සිටියේය. එහිදී විශේෂ අවධානයක් යොමුකරනු ලැබුවේ සීගිරිය, දිගම්පතන සහ ගල්ගමුව ප්‍රදේශවල සිදුවූ වන අලි මරණ 04ක් මුල්කරගෙනය.

ශ්‍රී ලංකාවේ වනාන්තර ආශ්‍රිතව ජීවත්වන අලි ඇතුන් බොහෝ දෙනෙක් දඩයක්කරුවන්ගේ හෝ අනවසර ගිනි අවි දරන්නන් හෝ ගොවීන්ගේ හෝ ප්‍රහාරයන්ට ලක්වන බවද මෙහිදී පෙන්වා දෙමින් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස එමගින් ඉල්ලා තිබුණි.

ඒ අනුව අලි ඝාතන පිටුපස පවතින බවට සැකකෙරෙන සංවිධානාත්මක කල්ලි හෝ දේශපාලන අනුග්‍රහය සහිත ජාල හඳුනා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් විශේෂ විමර්ශනයක් ආරම්භ කළද එවැනි සංවිධානාත්මක අලි ඝාතනයක් ගැන තොරතුරු අනාවරණ වීමක් මෙතෙක් සිදුව නැත. නමුත් සිදුවූ සෑම අලි ඝාතනයක් සම්බන්ධයෙන්ම පාහේ සැකකරුවන් අත්අඩංගුවට ගත් අතර වැඩි දෙනෙක් ගොවීන්ය. සිය වගා හානිකිරීම් සම්බන්ධයෙන් වන අලි සමග උරණව වන අලින්ට වෙඩිතබා ඇති බව විමර්ශනවලින් අනාවරණ වී තිබුණි.



### 08. මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය සුනිල් වටගල

කොළඹ ප්‍රසිද්ධ නිවාස සංකීර්ණයකින් තමා සුඛෝපභෝගී නිවසක් මිලදීගත් බවට සමාජ මාධ්‍ය හරහා අසත්‍ය හා ද්වේෂසහගත අපහාසාත්මක ප්‍රචාරයක් සිදුකළ බවට 2025 වසරේ සැප්තැම්බර් 16 වැනිදා නියෝජ්‍ය ඇමැති සුනිල් වටගල මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කළේය.

පොලිසිය භාර නියෝජ්‍ය ඇමැතිවරයා කළ එම පැමිණිල්ල සම්බන්ධයෙන්ද විමර්ශනයක් කළ බවක් හෝ සැකකරුවෙක් අත්අඩංගුවට ගත් බවක් අනාවරණ වන්නේ නැත.

මේ සම්බන්ධයෙන් සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යවරයා පොහොට්ටුවට සම්බන්ධ ආචාර්ය මහින්ද පතිරණගෙන් රුපියල් බිලියන 10ක වන්දියක් ඉල්ලා එම වසරේම නොවැම්බර් 15 වැනිදා එන්තර වාසියක්ද යොමුකර තිබුණි.

අනතුරුව දෙසැම්බර් 24 වැනිදා කඩුවෙල දිසා අධිකරණයේ නඩු පැවරීමක්ද සිදුකර තිබේ.



### 09. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍ය වසන්ත සමරසිංහ

විදෙස් සංචාරයක් සම්බන්ධයෙන් සිය මහජන සම්බන්ධතා නිලධාරිනිය ඉලක්කර ගනිමින් ව්‍යාජ තොරතුරු හා සංස්කරණය කරන ලද ඡායාරූප සමාජ මාධ්‍ය වෙත මුදාහැර ඇති බව සඳහන් කරමින් වසන්ත සමරසිංහ ඇමැතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරනු ලබන්නේ 2025 වසරේ ඔක්තෝබර් 09 වැනිදාය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශය විසින් පැමිණිල්ලේ නම් කර ඇති ෆේස්බුක් ගිණුම් 10 සහ වෙබ් අඩවිවල අයිතිකරුවන්, ඒවා ක්‍රියාත්මක කළ ස්ථාන ව්‍යාජ ඡායාරූප නිර්මාණය කළ ආකාරය පිළිබඳ තාක්ෂණික සාක්ෂි රැස්කිරීමේ මූලික විමර්ශන සිදුකළත් මේ දක්වා සැකකරුවෙක් අත්අඩංගුවට ගැනීමක් සිදුව නැත.

එම පැමිණිල්ලද විමර්ශන ගොනුවකට පමණක් මේ වනවිට සීමාවී ඇති බව සඳහන්ය.



### 10. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය සමන්ත විද්‍යාරත්න

පාර්ලිමේන්තු මන්ත්‍රී චාමර සම්පත් දසනායක පාර්ලිමේන්තුවේදී සිදුකළ ප්‍රකාශයක් මගින් තම දරුවාට අපහාසයක් සිදුව ඇති බවට සඳහන් කරමින් සමන්ත විද්‍යාරත්න අමාත්‍යවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලබන්නේ 2025 වසරේ ඔක්තෝබර් 09 වැනිදාය. අදාළ ප්‍රකාශයෙන් අනතුරුව තම දරුවාට එරෙහිව සමාජ මාධ්‍යවල සටහන් පළවීම සම්බන්ධයෙන්ද ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සයිබර් අපරාධ අංශය හමුවේ පැමිණිලි ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධයෙන් ඵලදායී විමර්ශනයක් සිදුවූ බවට තොරතුරු අනාවරණ වන්නේ නැත. මෙම පැමිණිල්ලද හුදෙක් තවත් එක් පැමිණිල්ලක් බවට පත්ව ඇති බව පෙනීයයි.



### 11. ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද ලලිත් කුමාර

මත්ද්‍රව්‍ය ජාවාරමට සිය කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක් සම්බන්ධ බවට හැඟවෙන පෝස්ටුවක් මුහුණු පොත ඔස්සේ හුවමාරු වීම සම්බන්ධයෙන් චමින්ද ලලිත් කුමාර මන්ත්‍රීවරයා පැමිණිල්ලක් කරනු ලබන්නේ මීරිගම පොලීසියටය. ඒ 2025 වසරේ නොවැම්බර් 11 වැනිදාය. මත්ද්‍රව්‍ය සමග ඔහුගේ ලේකම්වරයෙක් අත්අඩංගුවට ගෙන ඇති බවත් මන්ත්‍රීවරයා විසින් බලපෑම් කර ඔහුව නිදහස් කරගෙන ඇති බවටත් එමගින් කියැවී තිබුණි. එම පෝස්ටුව ඊට දින දෙකකට පෙර සමාජ මාධ්‍යවල හුවමාරුවී ඇත.

සැබෑ ලෙසම එවැනි සිදුවීමක් වී ඇති බව අනාවරණ වන්නේ නැත. මන්ත්‍රීවරයා විසින් ඒ සම්බන්ධයෙන් මීරිගම පොලීසියට පැමිණිල්ලක් කළද එය හුදෙක් පැමිණිල්ලක් පමණක් බවට පත්ව ඇත. කිසිදු සැකකරුවෙක්ද අත්අඩංගුවට ගැනීමට හෝ ඒ ගැන පොලිසිය විමර්ශනයක් කර ඇති බවක්වත් දැනගන්නට නැත.



### 12. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති

බලපත්‍ර නොමැතිව මෙරටට ආනයනය කරන ලද බහාලුම් තොගයක් නිදහස්කර දීම සඳහා සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යවරයා මැදිහත් වන බවට ඇඟවෙන සමාජ මාධ්‍ය ජාලවල ප්‍රචාරය වූ හඬ පටයක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලබන්නේ 2025 නොවැම්බර් 26දාය. මෙම පැමිණිල්ල සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් කරනු ලබන්නේ පාර්ලිමේන්තුවේදී මෙදින විපක්ෂයේ මන්ත්‍රීවරු කළ දැඩි ප්‍රශ්න කිරීමකින් අනතුරුවය.

මේ ගැන වූ විමර්ශනවල අවසානයක් තවමත් නැති අතර හඬ පටය කෘත්‍රිම බුද්ධියෙන් සකස් කළ එකක්දැයි සොයාබැලීමට රස පරීක්ෂකවරයාට යොමුකර ඇතත් තවමත් එකී පැමිණිල්ල ඇත්තේ විමර්ශන තත්ත්වයේය.



### 13. මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍ය සුනිල් වටගල

සිය නම සහ අස්සන අවභාවිත කරමින් පුද්ගලයෙක් විසින් විදෙස් ගමන් බලපත්‍ර 17ක් ලබාගැනීමක් සම්බන්ධයෙන් වූ ජාවාරමක් සම්බන්ධයෙන් නියෝජ්‍ය අමාත්‍ය සුනිල් වටගල විසින් පොලිස්පතිවරයාට පැමිණිල්ලක් කරනු ලබන්නේ 2024 වසරේ දෙසැම්බර් 27 වැනිදාය. සුනිල් වටගල මහතා අමාත්‍ය ධුරයේ වැඩ බාරගත් මුල්ම දිනයේදී මෙම වංචාව සිදුවී ඇත.

ජනාධිපති ලේකම් කාර්යාලයෙන් පැමිණි බව පවසමින් අමාත්‍යාංශ නිලධාරීන් මුළා කළ 'නිශාන්ත' නමැති බාහිර පුද්ගලයකු, නියෝජ්‍ය අමාත්‍යවරයාගේ නියෝගයක් බව පවසා ගමන් බලපත්‍ර 17ක් රැගෙන පලාගොස් තිබුණි. එම පැමිණිල්ලට වූ දෙයක් සොයාග න්නට නැත. සැකකරු අත්අඩංගුවට ගැනීමක් ගැනද වාර්තා වන්නේ නැත.



### 14. සෞඛ්‍ය හා ජනමාධ්‍ය ඇමැති නලින්ද ජයතිස්ස

ඇමැති නලින්ගෙන් සිය නම භාවිත කරමින් මහජනතාවගෙ න් මුදල් ලබාගන්නා ජාවාරමක් සිදුවන බවට පැමිණිල්ලක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබෙන්නේ පසුගිය මාර්තුවේදීය. අමාත්‍යවරයාගේ නමට සමාන වන පරිදි ව්‍යාජ බැංකු ගිණුම් සකස් කර, භික්ෂූන් වහන්සේ නමකට රෝද පුටුවක් ලබාදීමට මුදල් අවශ්‍ය බව පවසමින් සමාජ මාධ්‍ය සහ විවිධ මාර්ග ඔස්සේ මහජනතාවගෙන් ආධාර මුදල් එකතු කරමින් මෙම වංචාව සිදුව තිබුණි.

මෙම වංචාව සිදුකර තිබුණේ විදේශගතව සිටි පිළිමතලාවේ පදිංචිකරුවෙකි. ඔහු තවත් ඇමැතිවරු කිහිප දෙනෙකු ලෙස පෙනීසිටිමින් මෙම වංචාව සිදුකර ඇත. විදේශගතව සිටි ඔහු මෙරටට පැමිණෙමින් සිටියදී අප්‍රේල් 06දා අත්අඩංගුවට ගත් අතර ඔහු සම්බන්ධයෙන් අධිකරණ කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී.

ඇමැති නලින්ද ජයතිස්ස විසින් ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ, බස්නාහිර පළාත් හිටපු මන්ත්‍රී නිරෝෂන් පාදුක්ක සහ විද්‍යුත් මාධ්‍ය නාලිකාවකට එරෙහිව රුපියල් බිලියනයක් ඉල්ලා අපහාස කිරීමකට එරෙහිව එන්තරවාසියක් යොමුකරනු ලබන්නේ ඉකුත් පෙබරවාරියේදීය.

අසාදු ලේඛනගත ඖෂධ සමාගමක ක්‍රෙඩිට් කාඩ්පතක් භාවිත කර අමාත්‍යවරයා භාණ්ඩ මිලදී ගත් බවට ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා ප්‍රසිද්ධ රැස්වීමකදී කළ චෝදනාවක් මුල්කරගෙන එම එන්තරවාසිය යොමුකර තිබුණි. ඒ සම්බන්ධයෙන් වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා කොළඹ දිසා අධිකරණයේ රුපියල් බිලියනයක වන්දි ඉල්ලා නඩුවක් ගොනුකර ඇත. මෙතෙක් එම නඩුව විභාගයට ගෙන ඇති බවක් අනාවරණ වන්නේ නැත.

සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙක් ලෙස මේ වනවිට කටයුතු කරන ධර්ම ශ්‍රී කාරියවසම්ට එරෙහිවද ඇමැති නලින්ද ජයතිස්ස රුපියල් බිලියනයක් ඉල්ලා එන්තරවාසියක් යොමුකරන්නේ ජනවාරියේදීය. ඔන්ඩන් සෙට්‍රෝන් නමැති ඖෂධයේ කාණ්ඩ කිහිපයක් වෙළෙඳපොළෙන් ඉවත් කරගැනීමේ සිද්ධියක් මුල් කරගනිමින්, අමාත්‍යවරයාගේ නම ඈඳා කළ මාධ්‍යකරණයක් සම්බන්ධයෙන් තමාට අපහාස කිරීමට උත්සාහ කළ බව පවසමින් අමාත්‍යවරයා විසින් මෙම එන්තරවාසිය යොමුකර තිබුණි.

එම එන්තරවාසිය ප්‍රතික්ෂේප කරමින් පිළිතුරු ලිපියක් යොමුකරමින් එම ලිපියෙන් තමාට අපහාසයක් වූ බව සඳහන් කරමින් ධර්ම ශ්‍රී කාරියවසම් විසින් ඇමැතිවරයාගෙන් රුපියල් බිලියන 02ක වන්දියක් ඉල්ලා තිබුණි.

අවසානයේදී සිදුවන්නේ නලින්ද ජයතිස්ස මහතා විසින් පසුගිය පෙබරවාරි 09 වැනිදා කැස්බෑව දිසා අධිකරණයේදී ධර්ම ශ්‍රී කාරියවසම්ට එරෙහිව නඩුවක් පැවරීමට පියවර ගැනීමය.

මැදපෙරදිග කලාපයේ ඇතිවූ යුදමය තත්ත්වය හමුවේ ඉන්ධන භාවිතය අවම කිරීමට රජය විසින් කිව්.ආර්. කේතය හඳුන්වා දුන්නේය. එම කේතය වංචනික ලෙස භාවිත කරන බවට පැමිණිල්ලක් පසුගිය මාර්තු 19 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කරනු ලබන්නේ ඩිජිටල් ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදේශන සුමුදු රත්නායක විසිනි.

අනතුරුව කැබිනට් ප්‍රකාශක අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා විසින් මාර්තු 22 වැනිදා පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී එම විමර්ශනවල ප්‍රගතිය ගැන සඳහන් කරමින් පවසන්නේ හඳුනාගත් 153කට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස පොලිසියට සහ සී.අයි.ඩී.ය වෙත උපදෙස් දුන් බවය. එහෙත් අදටත් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන ඇත්තේ එක් සැකකරුවෙක් පමණි. ඒ මාර්තු 25 වැනිදාය.

පොල්ගස්ඕවිට පදිංචිකරුවෙක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ එම ප්‍රදේශයේ ඉන්ධන පිරවුම්හලකින් ඉන්ධන ලබාගන්නා අවස්ථාවේදීය. මෙම සැකකරු ඇප් එකක් මගින් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර කුලී රථ සමාගමකට සම්බන්ධව මෝටර් රථයක් ධාවනය කරනු ලබන අයෙකි.

කාන්තාවකට අයත් මෝටර් රථයක වැසි අංකය සහ ලියාපදිංචි අංකය සොරාගෙන මෙම පුද්ගලයා විසින් කිව්.ආර්. කේතය සකස්කරගෙන ඇතැයි විමර්ශනයේදී අනාවරණ වී තිබේ. ඒ හැරුණු කොට මේ දක්වා කිසිදු සැකකරුවෙක් කිව්.ආර්. කේතය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් බවක් වාර්තා වන්නේ නැත.

### 15. මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියට සයිබර් ප්‍රහාරයක් එල්ල වන්නේ මෙම වසරේ ජනවාරි මාසයේදීය. අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර තිබූ ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනය වෙනස් කරමින් එම සයිබර් ප්‍රහාරය එල්ලකර තිබුණි.

රාජ්‍ය වෙබ් අඩවියකට අනවසරයෙන් ඇතුළු වී සිදුකළ මෙම සයිබර් ප්‍රහාරය ගැන පසුගිය ජනවාරි 09 වැනිදා මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාලගේ උපදෙස් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කරනු ලබන්නේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසිනි.

දැන් සැලකිය යුතු කාලයක් ගෙවී හමාරය. පොලිසිය භාර අමාත්‍යාංශයේ වෙබ් අඩවියට රිංගූ හැකර්වරුන් තාමත් සිටින්නේ නිදැල්ලේය.

- 2025 වසරේ පෙබරවාරි 09 වැනිදා මුළු රට පුරාම සිදුවූ විදුලි බිඳවැටීම ගැන ආණ්ඩුව පැත්තෙන් සැකමුසු චෝදනා එල්ල කරන්නට වූයේ එය විපක්ෂය විසින් කළ කඩාකප්පල්කාරී ක්‍රියාවක් බවටය. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුව විමර්ශනයක් ඉල්ලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටද යන බවද කීය. පාර්ලිමේන්තුව තුළද පක්ෂ විපක්ෂ දේශපාලනඥයන් අතර දැඩි වාද විවාදයන්ද ඒ සම්බන්ධයෙන් සිදුවිය.

විදුලි බිඳවැටීමෙන් දින 03කට පසු ඒ ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ තාක්ෂණික ඉංජිනේරු හා අධිකාරී සංගමය ඇතුළු වෘත්තීය සමිති කිහිපයක් විසිනි. එහිදී ඔවුන් ඉල්ලා සිටියේ විදුලි සැපයුම් පද්ධතියේ පවතින අවදානම්සහගත තත්ත්වයන් මගහරවා ගැනීමට ගතයුතු පියවර නිසි පරිදි ඉටු නොකිරීම සහ ඒ පිටුපස පවතින වගකීම් පැහැර හැරීම් පිළිබඳ විධිමත් විමර්ශනයක් පවත්වන ලෙසය.

එම අවස්ථාවේදී ඔවුන් වෙනුවෙන් අදහස් දක්වමින් එම සංගමයේ උපසභාපති නන්දන උදය කුමාර මහතා ප්‍රකාශ කළේ, ජාතික විදුලි සැපයුම් පද්ධතියේ පවතින අවදානම්සහගත තත්ත්වයන් මගහරවා ගැනීමට ගතයුතු නිසි පියවරයන් ඉටු නොකිරීම පිළිබඳ සොයාබැලීමට මෙම පැමිණිල්ල මගින් ඉල්ලා සිටින බවය.

මේ හැරුණු කොට ආණ්ඩුව පාර්ශ්වයෙන් හෝ අමාත්‍යවරයාගේ පාර්ශ්වයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ පොලිසියකට පැමිණිල්ලක් ඉදිරිපත් වූ බවක් සොයාගන්නට නැත.

විදුලි බිඳවැටීම කඩාකප්පල්කාරී ක්‍රියාවක් බවට ආණ්ඩුව පැත්තෙන් සැක කළද අවසානයේදී රාජ්‍ය මට්ටමේ නිල තාක්ෂණික විමර්ශන වාර්තා මගින් විදුලිය බිඳවැටීමට බලපෑ සැබෑ හේතු තහවුරු වීමත් සමග ඒ හැම සැකයක්ම දුරුවන්නේ වඳුරෙකුට සියලු චෝදනා ගොනුවෙමිනි.

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් පිරවුම්හල්වලට ඉන්ධන ලීටරයකින් ලැබුණු සියයට 03 වට්ටම අහෝසි කිරීම නිසා තෙල් ඇණවුම් නොකිරීමට 2025 වසරේ පෙබරවාරි අග සහ මාර්තු මුල ඉන්ධනහල් හිමියන් ගත් පියවර පිරවුම්හල් අසල දිගු රථවාහන පෝලිම් ඇතිවීම දක්වා දුරදිග ගියේය.

ආණ්ඩුවේ මැති ඇමැතිවරු ඒ සම්බන්ධයෙන් සිය ස්ථාවරයන් ප්‍රකාශයට පත්කරන විට අල්ලස්, දූෂණ හා නාස්තියට එරෙහි පුරවැසි බලය සංවිධානයේ සභාපති ජාමුනි කමල් තුෂාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් 2025 වසරේ මාර්තු 03දා පැමිණිල්ලක් කරනු ලබන්නේ මෙය කෘත්‍රිම ඉන්ධන හිඟයක් මවා මහජනතාව පීඩාවට පත්කිරීමට කුමන්ත්‍රණයක් බව පවසමිනි.

මෙම පැමිණිල්ල සිදුකර පැය 24ක් යන්නට මත්තෙන් ක්‍රියාත්මක වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉන්ධන බෙදාහරින්නන්ගේ සංගමයේ උපසභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන්නුවේය.

ඉන්ධන ඇණවුම් නොකර හැරීමට ගත් තීරණය සහ බෙදාහැරීම් ජාලය අඩාළ කිරීමට කුමන්ත්‍රණය කළේද යන්න පිළිබඳ ඔවුන්ගෙන් දීර්ඝ ප්‍රශ්නද කළේය.

පොලිස් මාධ්‍ය කොට්ඨාසයද මෙහිදී නිල නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ අත්‍යාවශ්‍ය සේවාවක් වන ඉන්ධන සැපයුම සිතාමතා අඩාළ කරන, මහජනතාව පීඩාවට පත්කරන හෝ රජය අපහසුතාවට පත්කිරීමට කුමන්ත්‍රණය කරන සියලු පුද්ගලයන්ට එරෙහිව තරාතිරම නොබලා දැඩිව නීතිය ක්‍රියාත්මක කරන බවය.

ඒ අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වහාම මැදිහත් වී පිරවුම්හල් වෙත අවශ්‍ය තොග නිකුත් කිරීම වේගවත් කළේය. දින කිහිපයක් ඇතුළත දිගු පෝලිම් තත්ත්වය මගහැරී සැපයුම සාමාන්‍ය අතට පත්විය. ඒත් සමගම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කඩිමුඩියේ කළ විමර්ශනයටද නැවතීමේ තිත තැබෙන්නේ එය තවත් හුදු විමර්ශනයක් බවට පත්වෙමිනි.

රුවන් වෙඩිවර්ධන